# වෙබ් අඩවි නිර්මාණය සඳහා

# H T M L

M . අයේෂ් චානුක

# වෙබ් අඩවි නිර්මාණය සඳහා HTML

M. අයේෂ් චානුක

වෙබ් අඩවි නිර්මාණය සඳහා HTML

© M . අයේෂ් චානුක

නිකුත්කිරීම - 2018 දෙසැම්බර්

සියළුම හිමිකම් ඇවිරිණි

**කර්තෘගේ මීළඟට නිකුත් වීමට නියමිත කෘති**

වෙබ් අඩවි නිර්මාණය සඳහා CSS

වෙබ් අඩවි නිර්මාණය සඳහා PHP

පයිතන් ක්‍රමලේඛ භාෂාව

https://www.e-ketha.home.blog

https://www.facebook.com/eketha

# පිදුම

තොරතුරු තාක්ෂණ විෂය ඔස්සේ

ජීවිතය ජය ගන්නට

මං පෙත් විවරකර දුන්

**සුමුදු අබේසූරිය ගුරු පියාණන්ට**

ගෞරවයෙන් පිළිගන්වමි

# කතෘගෙන්

අන්තර්ජාලය අතිශය දියුණු යුගයක සිටින ඔබට අන්තර්ජාලය යනු කුමක්ද යන්න පැහැදිලි කිරීමට අවශ්‍ය නොවන බව මා දනිමි. පෙරකී දියුණුව නිසාම රජයේ ආයතන ,විශාල පෞද්ගලික ව්‍යාපාර මෙන්ම නගරයේ ඇති කුඩා කඩසාප්පු හිමියන්ද තම ව්‍යාපාරයේ දියුණුවට පෞද්ගලික වෙබ් අඩවි භාවිතා කරමින් ජනතාව වෙත සමීප වී ඇත. අද වන විට කිසිදු වයස් භේදයකින් තොරව අන්තර්ජාලය භාවිතා වන නිසා විශාල පුද්ගලයින් සංඛ්‍යාවක් මෙම වෙබ් අඩවි භාවිතා කරයි. ඒ තුළින් ව්‍යාපාරවලට මෙන්ම පාරිභෝගිකයාටත් විශාල පහසුවක් සැලසේ. එමෙන්ම අන්තර්ජාලය මගින් ඉගනීම, අන්තර්ජාලය මගින් ඉගැන්වීම, අන්තර්ජාල රැකියා සහ විනෝදාශ්වාද වැනි ක්ෂේත්‍ර ඔස්සේ අන්තර්ජාලය වේගවත්ව දියුණුවී ඇත.

ඉහත සඳහන් ක්ෂේත්‍ර මෙන්ම තවත් විශාල ක්ෂේත්‍ර ගණනාවක් පදනම් කරගෙන වෙබ් අඩවි නිර්මාණය වෙමින් පවතී. එමනිසා වෙබ් අඩවි නිර්මාණය අද වන විට විශාල ආදායමක් ලැබිය හැකි ආදායම් මාර්ගයක් බවට පත්වී ඇත. එමෙන්ම වෙබ් අඩවි නිර්මාණය අද සියලු දෙනා දැන ගත යුතු විෂය ක්ෂේත්‍රයක්වී ඇත.එම නිසාම වෙබ් අඩවි නිර්මාණය පිළිබඳ පාසල් විෂය නිර්දේශයටද ඇතුළත්ව පවතී .

මෙම ග්‍රන්ථය තුළින් ඔබට ඒ පිළිබද මනා දැනුමක් ලැබේ යැයි මගේ හැඟීමයි. පෙර කී පරිදි තාක්ෂණය සහ අන්තර්ජාලය කෙතරම් දියුණු වුවද මෙවැනි වටිනා විෂය ක්ෂේත්‍ර පිළිබද සිංහල මාධ්‍යයෙන් ලියවී ඇති පොත් ඉතා අල්පය. එම හිඩැස සුළුවශයෙන් හෝ පිරවීමට මෙම ග්‍රන්ථයෙන් හැකි වේයැ යි මම සිතමි.

අවසාන වශයෙන් තොරතුරු තාක්ෂණ විෂයෙහි මාගේ දැනුම වර්ධනය කිරීමට කැපවී ක්‍රියාකරන සුමුදු අබේසූරිය ගුරු පියාණන්ට මාගේ ගෞරවණීය ස්තූතිය පුදකර සිටිමි. මගේ මව පියා ඇතුලු පවුලේ සියළු දෙනාටත් ,මෙම ග්‍රන්ථය කියවමින් තව තවත් අදහස් ලබා දෙමින් මා දිරිමත් කරන මා හා ඉගනුම ලැබූ සොයුර සොයුරියන්ටත් උදවු උපකාර කළ සියල්ලන්ටත් විශේෂ ස්තූතිය පුදකර සිටිමි.

මෙම ග්‍රන්ථය පිළිබඳව පාඨක ඔබගේ අදහස් මාවෙත ඉදිරිපත් කිරීමට හැකිනම් එය ඉතා අගයකොට සලකමි එය මෙම ග්‍රන්ථයේ අඩුපාඩු හදුනා ගැනීමටත් ඒවා නිවරදි කරමින් ඉදිරි ග්‍රන්ථ සම්පාදනය කිරීමටත් ඉමහත් රුකුලක් වනු ඇත

M . අයේෂ් චානුක.

e-mail : ayesh.csm@gmail.com
eketha.acs@gmail.com

# පාඨක ඔබට

මෙම ග්‍රන්ථය උසස් පෙළ විෂය නිර්දේශය ඉලක්ක කොට නිර්මාණය කරන ලද්දකි. එබැවින් විෂය නිර්දේශයට අදාල නොවන කොටස් මෙම ග්‍රන්ථයෙන් දීර්ඝ වශයෙන් පැහැදිලි කිරීමට බලාපොරොත්තු නොවේ. එවැනි විෂය නිර්දේශයට අදාල නොවන කොටස් පැහැදිලි කිරීමෙදී ඒ පිළිබඳව සඳහන් කර ඇත.

එමෙන්ම මෙම ග්‍රන්ථය ප්‍රායෝගික විශය ඒකකයක් පිළිබඳව සම්පාදනය වූ ග්‍රන්ථයකි. එම නිසා මෙම ග්‍රන්ථයෙන් පැහැදිලි කර ඇති සියළුම කොටස් ප්‍රායෝගිකව අත්හදාබලා ඒවායේ කුඩා වෙනස්කම් සිදුකරමින් නැවත නැවත අත්හදා බලමින් මෙම ග්‍රන්ථය පරිශීලනය කිරීම මඟින් මෙම ග්‍රන්ථයෙන් උපරිම ප්‍රයෝජන ලබා ගැනීමට හැකිවනු ඇතැයි මගේ විශ්වාසයයි. එලෙස ප්‍රායෝගික අත්හදා බැලීම් කිරීමෙදී ඇතිවිය හැකි ගැටළු හැකිතාක් හදුනාගනිමින් ඒවාට විසදුම් සැපයීමටද මෙම ග්‍රන්ථය තුලින් උත්සහ දරා ඇත. ඒ සඳහා විශේෂයෙන්ම අවසාන පරිච්ඡේදය වන අතිරේක කියවීම් තුල ඉඩක් වෙන්කර ඇත.
එමෙන්ම ප්‍රායෝගික ක්‍රියාකාරකම් සිදුකිරීමට රුකුලක් වශයෙන් මෙම ග්‍රන්ථයේ පැහැදිලි කර ඇති සියළු උදාහරණ වලට අදාල වෙබ් පිටු එකතුවක් සහිත ගොනුවක් ඔබ වෙත ඉදිරිපත් කර ඇත.පහත වෙබ් පිටුව වෙත පිවිසීමෙන් එම ගොනුව ලබාගත හැක.


https://www.e-ketha.home.blog


මෙම ග්‍රන්ථය තුල දක්නට ලැබෙන සියළු උදාහරණවලට අදාල වෙබ් පිටු එම ගොනුව තුල දක්නට ලැබෙන අතර එමගින් යම් උදාහරණයක් පිළිබඳව ගැටළුවක් ඇතිවූ විට එය නිරාකරණය කරගැනීමට පහසුවනු ඇත.


එම ගොනුවේ ප්‍රධාන වෙබ් පිටුව index ලෙස නම් කර ඇති අතර එය හරහා අනෙකුත් සියළු වෙබ් පිටුවලට ගමන් කළ හැක. එබැවින් index වෙබ් පිටුව හරහා සම්පූර්ණ ගොනුවම පරිශීලනය කළ හැක.


එමෙන්ම මෙම ග්‍රන්ථය සාම්ප්‍රදායක ග්‍රන්ථයක් මෙන් නොව ඊ-පොතක් ලෙසින් එබට පිළිගැන්වෙන නිසා සාමාන්‍ය ග්‍රන්ථයකට වඩා වෙනස් අත්දැකීමක් ඔබට සමීප වනු ඇත.

ග්‍රන්ථය තුල විවිධ ස්ථාන වල කෙටි මාර්ග නිර්මාණය කර ඇත. එමගින් ඉතා පහසුවෙන් එක් එක් පිටු සඳහා පිවිසීමේ හැකියාව ඔබවෙත ලබා දී ඇත.



# පටුන


| | | |
|---|---|---|
| 01 | HTML අරඹමු | 08 |
| 02 | පළමු වෙබ් පිටුව | 12 |
| 03 | වෙබ් පිටුවට ඡේද ඇතුලත් කිරීම | 19 |
| 04 | පේළි වෙන් කිරීම | 23 |
| 05 | අක්ෂර හැඩගැන්වීම | 26 |
| 06 | විවරණ යෙදීම | 35 |
| 07 | තිරස් රේඛා යෙදීම | 37 |
| 08 | බහු මාධ්‍ය යෙදීම | 44 |
| 09 | පසුතලය සැකසීම | 55 |
| 10 | Marquee උසුලනය | 58 |
| 11 | HTML ලැයිස්තු | 63 |
| 12 | HTML වගු | 76 |
| 13 | HTML රාමු | 89 |
| 14 | HTML අධිසම්බන්ධක | 94 |
| 15 | HTML ෆෝරම(form) | 102 |
| 16 | වෙබ් පිටුව කොටස් කිරීම හා ඒවාට සම්බන්ධතා ඇති කිරීම | 122 |
| 17 | අතිරේක කියවීම් | 127 |

# 01

# HTML අරඹමු

- HTML හැඳින්වීම
- HTML ඉතිහාසය
- Text editor මෘදුකාංග
- HTML Tags හැඳින්වීම

# HTML හැඳින්වීම

Hyper Text Markup Language යන්නෙහි අක්නම HTML ලෙස හඳුන්වනු ලැබේ. මෙය ක්‍රමලේඛ භාෂාවක් නොවන අතර සලකුණු කිරීමේ කේතයක් වේ. Standard General Markup Language - SGML වල උපකුලකයක් වන මෙය සලකුණු කිරීමේ උසුලනයන් (markup tags) සමූහයකින් සමන්විත වේ.

# HTML ඉතිහාසය

HTML 1991 දී ටිම් බර්නස්ලී මහතා විසින් නිපදවන ලද්දකි .

නමුත් මෙය බොහෝ ජනප්‍රිය වනුයේ 1995 දී නිකුත් වූ HTML 2.0 නැමැති සංස්කරණය (version) සමග වේ.

ඉන් පසු ප්‍රධාන සංස්කරණයක් ලෙස 1999 දී නිකුත් වූ HTML 4.01 හදුන්වාදිය හැක.

එමෙන්ම මේවනවිට HTML-5 සංස්කරණය නිකුත්වී ඇති අතර එය එළිදක්වන ලද්දේ 2012 වර්ෂයේදීය.

# Text editor මෘදුකාංග


Html වෙබ් පිටුවක් සරලව සැකසීමට ඕනෑම Text editor මෘදුකාංගයක් භාවිත කළ හැක. පහත දක්වා ඇත්තේ බහුලව භාවිතා වන මෘදුකාංග දෙකකි.


Note pad




Note pad++




# HTML Tags (උසුලන)හැඳින්වීම

- HTML tags (උසුලන) කෝණ වරහනකින් < > දක්වනු ලැබේ.
- HTML උසුලනයක් සාමාන්‍යයෙන් යුගල වශයෙන් පවතින අතර තනි තනි උසුලනයන් ද දක්නට ලැබේ.
- යුගලයක පළමු උසුලනය පටන් ගන්නා උසුලනය හෙවත් විවෘත කිරීමේ උසුලනය වන අතර දෙවන උසුලනය අවසන් කරන හෙවත් වැසීමේ උසුලනය වේ.වැසීමේ උසුලනයට / සංකේතය යොදනු ලැබේ.
- ඇතැම් උසුලන වල උපලක්ෂණ ද පවතී ඒවා ප්‍රධාන උසුලනයෙන් පසුව යෙදිය හැක. අනුපිළිවෙළක් අවශ්‍ය නොවේ.



- මෙම උපදේශ කේත සඳහා කැපිටල් (CAPITAL) අකුරු හෝ සිම්පල් (simple) අකුරු භාවිත කළ හැකි වන අතර ඒ හේතුව නිසා කිසි වෙනසක් වෙබ් පිටුවල සිදුනොවේ.

**උදාහරණ**

<HTML> <Html> <HTml>

<htML> <HtMl>

- HTML උසුලන ඇමරිකානු ඉංග්‍රීසි භාෂාවෙන් නිර්මාණ වී ඇත.

**උදාහරණ**

- Centre ලෙස නොව center ලෙස සදහන් කළ යුතුය.
- colour ලෙස නොව color ලෙස සදහන් කළ යුතුය.

මෙම උසුලන පිළිබඳ මනා අවබෝධයක් මීළඟ පරිච්ඡේද අධ්‍යනය කිරීමෙදී ලැබෙනු ඇත.

උපලක්ෂණ වලට අගයන් යෙදීමේදී ඇතැම් අවස්ථාවල උඩු කොමායුගලය ( ' ') යෙදීම කළ යුතුය. එසේ යෙදීමෙදී සැලකිලිමත් විය යුතු කරුණු කීපයක් ඇති අතර එවා නිසි ලෙස භාවිතා නොකලහොත් වෙබ් පිටුවේ ක්‍රියාවලියට බලපෑම් එල්ල විය හැක එම කරුණු සම්භන්දව දීර්ඝ පැහැදිලි කිරීමක් අතිරේක කියවීම් තුල අඩංගු වේ.

අතිරේක කියවීම් වෙත ගමන් කිරීමට පහත බොත්තම Click කරන්න.


අතිරේක කියවීම් වෙත ගමන් කරන්න >>

# 02

# පළමු වෙබ් පිටුව

- වෙබ් පිටුවක මූලික කොටස් හදුනා ගැනීම
- මූලික HTML උසුලන හැඳින්වීම
- පළමු වෙබ් පිටුව නිර්මාණය කිරීම
- වෙබ් පිටුව සුරැකීම (save)
- වෙබ් පිටුවේ ව්‍යුහය උසුළන සමඟ සැසඳීම

# වෙබ් පිටුවක මූලික කොටස් හඳුනා ගැනීම



# මූලික HTML උසුලන හැඳින්වීම

වෙබ් පිටුවක් නිර්මාණය කිරීමේදී අවශ්‍යවන මූලික උසුලනයන් සහ ඒවා පිළිබඳව කෙටි හැදින්වීමක් පහත දැක්වේ.

| | |
|---|---|
| <html> | මගින් වෙබ් පිටුව ආරම්භ කරයි. |
| <head> | මගින් වෙබ් පිටුවේ ශීර්ෂය ආරම්භ කරයි. |
| <title> | මගින් වෙබ් පිටුවේ ශීර්ෂයට නමක් යෙදීම සිදු කරයි.<br>(මේතුළ සදහන් කරන සියලු දේ ශීර්ෂයේ සදහන් වේ.) |
| </title> | මගින් වෙබ් පිටුවේ ශීර්ෂයට නමක් යෙදීම අවසන් කරයි |
| </head> | මගින් වෙබ් පිටුවේ ශීර්ෂය අවසන් කරයි. |
| <body> | මගින් වෙබ් පිටුවේ කඳ කොටස ආරම්භ කරයි.<br>(මේ තුළ සදහන් කරන සියලු දේ කඳ කොටසේ සදහන් වේ.) |
| </body> | මගින් වෙබ් පිටුවේ කඳ කොටස අවසන් කරයි. |
| </html> | මගින් වෙබ් පිටුව අවසන් කරයි. |


# පළමු වෙබ් පිටුව නිර්මාණ කිරීම

ඕනෑම Text editor මෘදුකාංගයක් භාවිතා කර පහත පරිදි උසුලනයන් යොදන්න.

**උදාහරණ** chapter_02 / first_web_page.html

```
<html>
    <head>
        <title> First web page  </title>
    </head>
    <body>
        ආයුබෝවන්
        HELLO !
    </body>
</html>
```


මෙය Note pad++ මෘදුකාංගයේ පහත පරිදි යෙදිය හැක.





මෙලෙස උසුලන යොදා සකස් කළ කොටස වෙබ් පිටුවේ ප්‍රභව කේතය (source code) ලෙස හඳුන්වයි.

# වෙබ් පිටුව සුරැකීම (save)


දැන් මෙම ගොනුව html ගොනුවක් ලෙස සුරැකිය යුතුය.ඒ සඳහා සාමාන්‍ය පරිදි File >> save වෙත ගමන් කර save කල හැක. (කෙටි යතුර - ctrl + s )





වැදගත්ම කරුණ වන්නේ save කරන විට ලබාදෙන නම අවසානයේ .html ලෙස ලබා දිය යුතුවීමයි. මෙය ගොනුවේ ගොනු දිගුව ලෙසද හැඳින්වේ. උදාහරණයක් ලෙස ගොනුවේ නම first web page නම් එය first web page.html ලෙස යොදා සුරකිය යුතුය.




ඉහත වෙබ් පිටුවේ සඳහන් පරිදි සිංහල අකුරු Unicode අක්ෂර ක්‍රමය භාවිතා කරන්නේ නම් Encoding යන්න unicode ලෙස තෝරාගත යුතුය. එය Notepad මෘදුකාංගය තුල නම් ගොනුව සුරකීමදී ලබාදිය හැක.




Notepad++ මෘකාංගය තුල නම් Encoding වෙත ගොස් තෝරා ගත හැක.



# වෙබ් පිටුවේ ව්‍යුහය උසුළන සමඟ සැසඳීම

දැන් මෙම ගොනුව ගබඩා වූ ස්ථානයේ සුරකීමෙදී ලබා දුන් නම සහිත ගොනුවක් පැවතිය යුතු අතර එය වෙබ් අතරික්සුවෙන් (Web browser) විවෘත වීමට සැකසී ඇත.




මෙම ගොනුව විවෘත කළ පසුව පහත පරිදි ප්‍රතිඵලයක් ලැබෙනු ඇත.





ඇතැම් විට එලෙස වෙබ් අතරික්සුවෙන් (web browser) විවෘත වීමට සූදානම් වී නොමැති අවස්ථාවන්ද තිබිය හැක. එවැනි අවස්ථාවන්හිදී ඇතිවිය හැකි ගැටළු සඳහා විසඳුම් අතිරේක කියවීම් තුල අඩංගුවේ.

එමෙන්ම වෙබ් පිටුව ගොඩනැගීමෙන් අනතුරුව නැවත නැවත වෙනස්කම් කිරීම පිළිබඳව පැහැදිලි කිරීමක් අතිරේක කියවීම් තුල අඩංගුවේ.

අතිරේක කියවීම් වෙත ගමන් කරන්න >>

ලැබී ඇති ප්‍රතිඵලය සහ එය නිර්මාණය කිරීමට යොදාගත් උසුලනයන් පහත පරිදි සැසඳීමක් සිදුකළ හැක.

මෙහි <titel> හා </title> අතර ඇති සියලු දෑ වෙබ් පිටුවේ ශීර්ෂයේ(head) මාතෘකාව ලෙස යෙදී ඇති අතර <body> හා </body> තුල ඇති සියලු දෑ වෙබ් පිටුවේ කඳ(body) තුල යෙදී ඇත.


*G:\my project\My HTML\first web page.html - Notepad++
File Edit Search View Encoding Language Settings Macro Run Plug
first web page.html
<html>
<head>
<title> First web page </title>
</head>
<body>
ආයුබෝවන්
HELLO !
</body>
</html>
First web page
file:///G:/my project/My HTML/
ආයුබෝවන් HELLO !

# 03

# වෙබ් පිටුවට ඡේද ඇතුලත් කිරීම

- <P> උසුලනය හදුනාගැනීම
- ඡේද ස්ථානගත කිරීම

# <P> උසුලනය හඳුනාගැනීම

ඡේද වෙන්කිරීමට html තුළ <p> උසුලනය භාවිතා කෙරේ.මෙම උසුලනයට </p> වැසීමේ උසුලනයක්ද භාවිතා වේ. මෙහිදී ඡේදයක් ලෙස ආරම්භ වියයුතු ස්ථානයේ මුලට <p> ආරම්භක උසුලනයත් අගට </p> අවසන් උසුලනයත් යෙදිය යුතුය. මෙහි p යනු Paragraph යන්න කෙටි කර දැක්වීමක් වේ.

උදාහරණ chapter_03 /paragraph.html

```
<html>
    <head>
        <title> paragraph-Example </title>
    </head>
    <body>
        <p>
            HTML stands for Hypertext Markup Language, and it is
            the most widely used language to write Web Pages.
        </p>
        <P>
            Hypertext refers to the way in which Web pages (HTML
            documents) are linked  together. Thus, the link
            available on a webpage is called Hypertext.
        </p>
</body>
</html>
```

ප්‍රතිඵලය සහිත වෙබ් පිටුවේ කඳ (body) කොටස පමනක් පහත දැක්වේ.

**ප්‍රතිඵලය** chapter_03 / paragraph.html

```
HTML stands for Hypertext Markup Language, and it is the most
widely used language to write Web Pages.

Hypertext refers to the way in which Web pages (HTML documents)
are linked  together. Thus, the link available on a webpage is
called Hypertext.
```

## ඡේද ස්ථානගත කිරීම

මේ සඳහා align නම් උපලක්ෂණය යොදාගත හැක. එහි අගයන් ලෙස center , right , left ලබා දිය හැක. එම අගයන් හී ක්‍රියාකාරීත්වය පහත පරිදි වේ.

| | |
|---|---|
| center | ඡේදය මැදට ස්ථානගත කරයි |
| right | ඡේදය දකුණට ස්ථානගත කරයි |
| left | ඡේදය වමට ස්ථානගත කරයි |

උදාහරණ chapter_03 /paragraph_align.html

```
<html>
    <head>
        <title> paragraph align-Example </title>
    </head>
    <body>
        <p align = “center”> This is center aligned. </p>

        <p align = “left”> This is left aligned. </p>

        <p align = “right”> This is right aligned. </p>
    </body>
</html>
```

ප්‍රතිඵලය chapter_03 /paragraph_align.html

This is center aligned.

This is left aligned.

This is right aligned.

# 04

# පේළි වෙන් කිරීම

- Html තුල පේළි හැසිරෙන ආකාරය
- <br> උසුලනය හදුනාගැනීම

# Html තුල පේළි හැසිරෙන ආකාරය

උදාහරණ chapter_03 /Line_Break(problem).html

```
<html>
    <head>
        <title> Line Break-Example</title>
    </head>
    <body>
        H
        T
        M
        L
    </body>
</html>
```

ප්‍රතිඵලය chapter_03 /Line_Break(problem).html

```
H T M L
```

ඉහත උදාහරණයෙන් පෙනී යන්නේ වෙබ් පිටුව සකසන අවස්ථාවේ පෙළින් පෙළට අක්ෂර යෙදීම සිදුකළද ප්‍රතිඵලයේ එම අක්ෂර දිස්වන්නේ එක පෙළට බවයි. එම නිසා නව පෙළකට ගමන් කිරීමටද උසුළන භාවිතා කළ යුතුය.

# <br> උසුලනය හඳුනාගැනීම

ඉහත ගැටළුවට විසඳුමක් ලෙස <br> උසුලනය හඳුන්වාදිය හැක. මෙහි br යනු Break යන්න කෙටි කර දැක්වීමක් වේ. එමගින් සිදුවන්නේ එම උසුලනය යෙදීමෙන් පසුව යොදන සියළු දේ නව පේළියක සටහන් වීමයි. එමෙන්ම මෙහි විශේෂත්වය වන්නේ අවසන් කිරීමේ උසුලනයක් හෙවත් </br> අවශ්‍ය නොවීමයි.

උදාහරණ — chapter_04 /Line_Break(solution).html

```
<html>
     <head>
          <title> Line Break-Example</title>
     </head>
     <body>
          H <br> T <br> M <br> L
     </body>
</html>
```

ප්‍රතිඵලය — chapter_04 /Line_Break(solution).html

```
H
T
M
L
```

# 05

# අක්ෂර හැඩගැන්වීම

- මූලික හැඩගැන්වීමේ උසුලන
- මාතෘකා උසුලන
- <font> උසුලනය සමඟ අක්ෂර හැඩගැන්වීම

# මූලික හැඩගැන්වීමේ උසුලන

| | |
|---|---|
| <b> | තද පැහැති (bold) අක්ෂර. |
| <i> | ඇද හැඩති (italic) අක්ෂර. |
| <u> | යටි ඉරක් සහිත (underline) අක්ෂර. |
| <s> | අකුරු හරහා ඉරක් සහිත (strike out) අක්ෂර |
| <sup> | උඩින් ලකුණු කරන ලද අක්ෂර.(Superscript) |
| <sub> | යටින් ලකුණු කරන ලද අක්ෂර.(Subscript) |

උදාහරණ chapter_05 /Text_formatting.html

```
<html>
    <head>
        <title> Text formatting-Example</title>
    </head>
    <body>
        This is a <b> Bold </b> text.  <br>
        This is a <i> Italic </i> text. <br>
        This is a <u> Underlined </u> text. <br>
        This is a <s> Strike</s> text. <br>
        <br>
        2<sup>3</sup> = 8 <br>
        H<sub>2</sub>O
    </body>
</html>
```

| ප්‍රතිඵලය | chapter_05 /Text_formatting.html |
|---|---|

```
This is a Bold text.<br>
This is a Italic <br>text.<br>
This is a Underlined text. <br>
This is a Strike text.
```

$2^3 = 8$

$H_2O$

මෙහිදී <b> සහ </b> අතර ඇති අක්ෂර තද පැහැ ගැන්වී ඇත. මෙලෙසම අනෙක් උසුලන වල ක්‍රියාකාරීත්වයද වටහා ගැනීමට අපහසු නොවනු ඇතැයි මගේ හැගීමයි.

## මාතෘකා උසුලන

<h1> සිට <h6> දක්වා උසුලන මාතෘකා සඳහා යොදා ගනී. මෙහි විශේෂත්වය වන්නේ මෙම උසුලනය යෙදූ අක්ෂර තද පැහැ වීම සහ උසුලනය අවසානයේදී නව පේළකට ගමන් කිරීමයි.

සරලව ගත්විට මෙම මාතෘකා උසුලන තුල <b> උසුලනයක් සහ <br> උසුලනයක ක්‍රියාකාරීත්වයද අන්තර්ගතව පවතී.

| | |
|---|---|
| <h1> | පළමු මට්ටමේ මාතෘකා. |
| <h2> | දෙවන මට්ටමේ මාතෘකා. |
| <h3> | තෙවන මට්ටමේ මාතෘකා. |
| <h4> | සිව්වන මට්ටමේ මාතෘකා. |
| <h5> | පස්වන මට්ටමේ මාතෘකා. |
| <h6> | සයවන මට්ටමේ මාතෘකා. |

උදාහරණ chapter_05 /heading.html

```
<html>
    <head>
        <title> heading-Example</title>
    </head>
    <body>
        <h1> This is heading 1 </h1>
        <h2> This is heading 2 </h2>
        <h3> This is heading 3 </h3>
        <h4> This is heading 4 </h4>
        <h5> This is heading 5 </h5>
        <h6> This is heading 6 </h6>
    </body>
</html>
```

ප්‍රතිඵලය chapter_05 /heading.html

# This is heading 1

## This is heading 2

### This is heading 3

#### This is heading 4

##### This is heading 5

###### This is heading 6

මෙහිදී අක්ෂර තද පැහැ ගැන්වීමක් සිදුවී ඇත එමෙන්ම br උසුලනක් නොයෙදුවද නව පෙළකට ගමන් කිරීමක් සිදුවී ඇත මෙවනි අවස්ථා සහිත උසුලන කිහිපයක්ම ඉදිරියේදී හමුවේ එවායේ මෙවැනි සැඟවුන ක්‍රියාකාරීත්වයන් හදුනාගැනීම ඉතා ප්‍රයෝජනවත් වනු ඇත

## <font> උසුලනය සමඟ අක්ෂර හැඩගැන්වීම

මෙම උසුලනය මගින් අක්ෂර සදහා විවිධ වෙනස්කම් කළ හැක. ඒ සඳහා විවිධ උපලක්ෂණ භාවිතා කළ හැකි අතර එම උපලක්ෂණ පහත වගුවේ විස්තර කර ඇත.

| | |
|---|---|
| size | අක්ෂර වල ප්‍රමාණය වෙනස්කළ හැකි අතර 1 සිට 7දක්වා අගයන් ලබාදිය හැක. |
| color | අක්ෂරයේ වර්ණය ලබාදිය හැක. |
| face | අක්ෂර වල පෙනුම වෙනස්කළ හැකි අගයන් සඳහා font වර්ගයේ නම ලබාදිය යුතුය. |

font උසුලනය සමඟ Size උපලක්ෂණයේ ක්‍රියාකාරීත්වය අවබෝධ කරගැනීමට පහත උදාහරණය සලකන්න.

**උදාහරණ** chapter_05 /Font_size.html

```
<html>
    <head>
        <title> Font size-Example</title>
    </head>
    <body>
        <font size = “7”> Font 7 </font> <br>
        <font size = “4”> Font 4 </font> <br>
        <font size = “1”> Font 1 </font>
    </body>
</html>
```

ප්‍රතිඵලය chapter_05 /Font_size.html

```
Font 7

Font 4

Font 4
```

font උසුලනය සමඟ color උපලක්ෂණයේ ක්‍රියාකාරීත්වය අවබෝධ කරගැනීමට පහත උදාහරණය සලකන්න.

උදාහරණ chapter_05 /Font_color.html

```
<html>
     <head>
          <title> Font color-Example</title>
     </head>
     <body>
          <font color = "red"> Red color </font> <br>
          <font color = "green"> Green color </font> <br>
          <font color = "blue"> Blue color </font>
     </body>
</html>
```

ප්‍රතිඵලය chapter_05 /Font_color.html

```
Red color
Green color
Blue color
```

මෙහිදී වර්ණ භාවිතා කළ හැකි ආකාර ආකාර 2 ක් පවතින අතර ඒ පිළිබඳව අවසාන පරිච්ඡේදය වන 'අතිරේක කියවීම්' තුල දීර්ඝ විස්තරයක් අඩංගු වේ.

අතිරේක කියවීම් වෙත ගමන් කරන්න >>

font උසුලනය සමඟ face උපලක්ෂණයේ ක්‍රියාකාරීත්වය අවබෝධ කරගැනීමට පහත උදාහරණය සලකන්න.

උදාහරණ chapter_05 /Font_face.html

```
<html>
    <head>
        <title> Font face-Example</title>
    </head>
    <body>
        <font face = “Calibri”> Hello </font> <br>
        <font face = “Consolas”> Hello </font> <br>
    </body>
</html>
```

ප්‍රතිඵලය chapter_05 /Font_face.html

Hello

Hello

මෙහිදී නිවරදි ලෙස ප්‍රතිදානය ලබාදෙන්නේ පරිගනකයේ පවතින අකුරු වර්ග යෙදීමේදී පමනි

පෙර අධ්‍යනය කල සියළු උපලක්ෂණ එකම උසුලනය යටතේ එකවර යෙදිය හැකි අතර ඒ සඳහා අනුපිළිවෙළක් අවශ්‍ය නොවේ.

පහත උදාහරණයේ අක්ෂරවල ප්‍රමාණය 5 ලෙසත් වර්ණය රතු ලෙසත් අකුරු වර්ගය Chiller ලෙසත් සකසා ඇති අතර ඒ සඳහා එකම Font උසුලනය යටතේ උපලක්ෂණ යොදා ඇත.

උදාහරණ chapter_05 /Font_attributes.html

```
<html>
     <head>
          <title> Font attributes-Example</title>
     </head>
     <body>
          <font color="red" size="5" face="Consolas"> Hello </font>
     </body>
</html>
```

ප්‍රතිඵලය chapter_05 /Font_attributes.html

Hello

මෙහිදී අප භාවිතා කරන අක්ෂර වර්ග මේ වනවිට පරිගණකයේ ස්ථාපනය කර තිබිය යුතුය.

එමෙන්ම උසුලන කිහිපයක්ද එකවර යොදා ගත හැක. ඒ පිළිබඳව අවබෝධ කර ගැනීමට පහත උදාහරණය සලකන්න.

උදාහරණ chapter_05 /All_In_One(Font tags).html

```
<html>
    <head>
        <title> All In One (Font tags) </title>
    </head>
    <body>
        <font color="red" size="5">
        <b><i>H T </i> M L</b>
        </font>
    </body>
</html>
```

ප්‍රතිඵලය chapter_05 /All_In_One(Font tags).html

***H T* M L**

# 06

# විවරණ යෙදීම

- විවරණ හඳුනාගැනීම
- විවරණ යෙදීමේ වැදගත්කම
- විවරණ යෙදීම

## විවරණ හඳුනාගැනීම

වෙබ් අඩවිය නරඹන්නාට නොව වෙබ් අඩවිය නිර්මාණකරුට පමණක් තම අවශ්‍යතාවන් අනුව html උසුලන අතර යෙදිය හැකි කොටස් විවරණ වේ.මේවා කිසිදු අයුරකින් ප්‍රතිදානය නොවේ.

## විවරණ යෙදීමේ වැදගත්කම

විශාල වෙබ් අඩවි නිර්මාණයේ දී පසුකලක අමතක වේ යැයි හැඟෙන කරුණු උසුලන අතර අවශ්‍ය සටහනක් ලෙස තැබීමට මෙය භාවිතා කළ හැක.එමගින් පසුකලක වෙබ් අඩවිය නැවත දියුණු කිරීමට පහසු වනු ඇති අතර වෙබ් අඩවියේ සංකීර්ණත්වය ද අඩුවී කොටස් පහසුවෙන් වෙන් කර බලා ගත හැකි වේ.

## විවරණ යෙදීම

මේ සඳහා විවරණය කිරීමට අවශ්‍ය කොටස <!-- සහ --> අතර යෙදිය යුතුය.

උදාහරණ chapter_06 /comments.html

```
<html>
    <head>
        <title> comments-Example</title>
    </head>
    <body>
        HTML stands for
        <!-- comment -->
        Hypertext Markup Language
    </body>
</html>
```

ප්‍රතිඵලය chapter_06 /comments.html

```
HTML stands for Hypertext Markup Language
```

# 07

# තිරස් රේඛා යෙදීම

- <hr> උසුලනය හැඳින්වීම
- තිරස් රේඛා යෙදීමෙදී භාවිතා වන උපලක්ෂණ
- රේඛාවේ ප්‍රමාණය
- රේඛාවේ වර්ණය
- රේඛාවේ දිග
- රේඛාවේ පිහිටීම

# <hr> උසුලනය හැදින්වීම

තිරස් රේඛා යෙදීම සඳහා <hr> උසුලනය භාවිතා කරයි. මෙහි hr යනු Horizontal Rules යන්න කෙටි කර දැක්වීමක් වේ.එමෙන්ම මෙහි එක් විශේෂත්වයක් වන්නේ අවසන් කිරීමේ උසුලනයක් හෙවත් </hr> අවශ්‍ය නොවීමයි.

උදාහරණ chapter_07 /Horizontal Rules .html

```
<html>
     <head>
          <title> Horizontal Rules-Example</title>
     </head>
     <body>
          Horizontal Rules
          <hr>
     </body>
</html>
```

ප්‍රතිඵලය chapter_07 /Horizontal Rules .html

Horizontal Rules

---

## තිරස් රේඛා යෙදීමේදී භාවිතා වන උපලක්ෂණ

| | |
|---|---|
| Size | රේඛාවේ ප්‍රමාණය. |
| Color | රේඛාවේ වර්ණය |
| Width | රේඛාවේ දිග (ප්‍රතිශත ලෙස හෝ pixel ප්‍රමාණය ලෙස.) |
| align | රේඛාවේ පිහිටීම |

## රේඛාවේ ප්‍රමාණය

උදාහරණ chapter_07 /Horizontal_Rules_size.html

```
<html>
     <head>
          <title> Horizontal Rules size-Example</title>
     </head>
     <body>
          <hr size = 5>
          <hr size = 10>
          <hr size = 15>
     </body>
</html>
```

ප්‍රතිඵලය chapter_07 /Horizontal_Rules_size.html

# රේඛාවේ වර්ණය

උදාහරණ chapter_07 /Horizontal_Rules_color.html

```
<html>
    <head>
        <title> Horizontal Rules color-Example</title>
    </head>
    <body>
        <hr color = “red”>
        <hr color = “green”>
        <hr color = “blue”>
    </body>
</html>
```

ප්‍රතිඵලය chapter_07 /Horizontal_Rules_color.html

## රේඛාවේ දිග

මෙය ප්‍රකාශ කළ හැකි ප්‍රධාන ආකාර 2 කි. පළමු ක්‍රමය දිග ප්‍රමාණය පික්සල් අගයන්ගෙන් ලබාදීමයි. දෙවන ක්‍රමය වන්නේ දිග ප්‍රමානය පිටුවේ සම්පූර්ණ දිගෙන් ප්‍රතිශතයක් ලෙස ලබා දීමයි.

**උදාහරණ** chapter_07 /Horizontal_Rules_width.html

```
<html>
     <head>
          <title> Horizontal Rules width-Example</title>
     </head>
     <body>
          <hr width = “50”>
          <hr width = “30”>
          <hr width = “50%”>
          <hr width = “30%”>
     </body>
</html>
```

**ප්‍රතිඵලය** chapter_07 /Horizontal_Rules_width.html

## රේඛාවේ පිහිටීම

මෙහිදී රේඛාවේ පිහිටීම වමට මැදට දකුනට ලෙස වෙනස් කළ හැක. මෙය හොදින් අවබෝධ කර ගැනීමට දිග 500 වූ රේඛාවක් (width = 500) උදාහරණයට ගෙන ඇත.

**උදාහරණ** chapter_07 /Horizontal_Rules_align.html

```
<html>
     <head>
          <title> Horizontal Rules align-Example</title>
     </head>
     <body>
          <hr width = 500 align = left>
          <hr width = 500 align = center>
          <hr width = 500 align = right>
     </body>
</html>
```


**ප්‍රතිඵලය** chapter_07 /Horizontal_Rules_align.html

ඉහත ඉගනගත් උපලක්ෂණ සියල්ල භාවිතා කරමින් පහත උදාහරණය නිර්මාණය කර ඇත.

උදාහරණ chapter_07 /All_In_One(Horizontal Rules).html

```
<html>
     <head>
          <title> All In One (Horizontal Rules) </title>
     </head>
     <body>
          <hr width=“50%” align=“left” color=“#ff0000” size=“20”>
          <hr width=“50%” align=“left” color=“#ee0000” size=“20”>
          <hr width=“50%” align=“left” color=“#dd0000” size=“20”>
          <hr width=“50%” align=“left” color=“#cc0000” size=“20”>
          <hr width=“50%” align=“left” color=“#bb0000” size=“20”>
          <hr width=“50%” align=“left” color=“#aa0000” size=“20”>
     </body>
</html>
```

ප්‍රතිඵලය chapter_07 /All In One (Horizontal Rules).html



මෙහිදී වර්ණ භාවිතා කළ හැකි ආකාර ආකාර 2 ක් පවතින අතර ඒ පිළිබඳව අවසාන පරිච්ඡේදය වන ‘අතිරේක කියවීම්’ තුල දීර්ඝ විස්තරයක් අඩංගු වේ.

අතිරේක කියවීම් වෙත ගමන් කරන්න >>

# 08

# බහු මාධ්‍ය යෙදීම

- පින්තූර ගොනුවක් යෙදීම
- Embed උසුලනය
- වීඩියෝ ගොනුවක් යෙදීම
- ශ්‍රව්‍ය ගොනුවක් යෙදීම

# පින්තූර ගොනුවක් යෙදීම

පින්තූර යෙදීම සඳහා ප්‍රධාන වශයෙන් img උසුලනය යොදා ගනී ඒ සමඟ භාවිතා කල හැකි උපලක්ෂණ පහත දක්වා ඇත.

| | |
|---|---|
| src | පින්තූර ගොනු මාර්ගය ගොනු නාමය සහ ගොනු දිගුව ලබා දිය යුතුය |
| alt | යම් දොශයක් නිසා පින්තූර දිස්නොවේ නම් ඡායාරූපය වෙනුවට පෙන්විය යුතු වාක්‍ය කණ්ඩය මේ යටතේ සඳහන් කල හැක |
| Align | පින්තූරය ස්ථාන ගත කිරීම |
| Border | වටේ දාරය සැකසීම |
| Width | දිග වෙනස් කිරීම |
| Height | උස වෙනස් කිරීම |
| Vspace | රූපයෙහි වම් පැත්තේ සහ දකුණු පැත්තේ ඉඩ සකස් කිරීම. |
| hspace | රූපයෙහි උඩ සහ යට ඉඩ ප්‍රමාණය සකස් කළ හැකි ය. |

Img උසුලනය යටතේ src උපලක්ෂණයට පින්තූරයේ ගොනු මාර්ගය ගොනු නාමය සහ ගොනු දිගුව ලබාදීමේදී ඉතා සැලකිලිමත් විය යුතුය. එයට හේතුව වන්නේ කුඩා හෝ අත්වැරදීමක් නිසා පින්තූරය ප්‍රතිදානය නොවිය හැකි වීමයි.

එම නිසා ගොනු මාර්ගය ගොනු නාමය සහ ගොනු දිගුව පිලිබඳව නිවරදිව දැන සිටීම වැදගත් වන අතර ඒ පිළිබඳව විස්තර කිරීමක් අතිරේක කියවීම් තුළ අඩංගු වේ.

අතිරේක කියවීම් වෙත ගමන් කරන්න >>

මෙහිදී අප යොදා ගන්නා පින්තූර ගොනුව අප නිර්මාණය කළ වෙබ් අඩවිය වන adding_image.html සමඟ පවතින data නම් folder තුල පවතින අතර ගොනුවේ නම වන්නේ fruits යන්නයි. එම ගොනුවේ ගොනු දිගුව png වේ.

උදාහරණ chapter_08 /adding_image.html

```
<html>
    <head>
        <title> adding image-Example</title>
    </head>
    <body>
        <img src = “data/fruits.png”>
    </body>
</html>
```

ප්‍රතිඵලය chapter_08 /adding_image.html



මීළඟ උදාහරණයෙදී පින්තූරයේ සත්‍ය නම වූ fruits වෙනුවට fruit ලෙස කුඩා වෙනස් කමක් කර නැවත වෙබ් පිටුවක් නිර්මාණය කරමු. එමෙන්ම alt කොටසට image of fruits ලෙස යෙදීමෙන් alt කොටස නිවැරදිව ක්‍රියාත්මක වේ දැයි පරීක්ෂා කල හැක.

**උදාහරණ** chapter_08 /alt.html

```
<html>
     <head>
          <title> alt-Example</title>
     </head>
     <body>
          <img src=“data/fruit.png” alt=“image of fruits”>
     </body>
</html>
```

**ප්‍රතිඵලය** chapter_08 /alt.html

```
image of fruits
```

මෙහිදී අප ඇතුලත් කළ ස්ථානයේ fruit නම් ගොනුවක් නොමැති බැවින් සාර්ථක ලෙස පින්තූරයක් ප්‍රතිදානය නොවීය. එම දෝශය නිසා alt යටතේ ලබාදුන් කොටස දර්ශනය වීමක් සිදුවී ඇත.

අප alt කොටසක් නොදුන්නේ නම් දිස්වන්නේ  වැනි කොටසකි.


එම නිසා වෙබ් පිටු නිර්මාණයෙදී සිදුවන දෝශ හෝ ජාලයේ සිදුවන දෝශ වැනි ඕනෑම සිදුවීමක් නිසා පින්තූර නිසිපරිදි දර්ශනය නොවිය හැක. එවැනි අවස්ථාවකදී වෙබ් අඩවි පරිශීලකගේ පහසුව වෙනුවෙන් පින්තූරයේ අඩංගු දේ පිළිබඳව කෙටි හැදින්වීමක් මෙලෙස දර්ශනය කල හැක.

මීළඟ උදාහරණයෙදී width සහ Height උපලක්ෂණ පිළිබඳව සලකා බලමු.

උදාහරණ chapter_08 /Height & width.html

```
<html>
    <head>
        <title> Height & width-Example</title>
    </head>
    <body>
        <img src = “data/fruits.png” height = 500 width = 500>
        <img src = “data/fruits.png” height = 300 width = 300>
        <img src = “data/fruits.png” height = 100 width = 100>
    </body>
</html>
```

ප්‍රතිඵලය chapter_08 /Height & width.html



මෙම උදාහරණයෙදී border උපලක්ෂණ පිළිබඳව සලකා බලමු.

උදාහරණ chapter_08 /image_border.html

```
<html>
    <head>
        <title> image border-Example</title>
    </head>
    <body>
        <img src = "data/fruits.png" border = 5>
        <img src = "data/fruits.png" border = 3>
        <img src = "data/fruits.png" border = 0>
    </body>
</html>
```

ප්‍රතිඵලය chapter_08 /image_border.html



# Embed උසුලනය


සියළු බහු මාධ්‍ය යෙදීමට හැකි පොදු උසුලනයක් ලෙස embed උසුලනය භාවිතා කළ හැක. මෙහිදී src යටතේ ලබාදෙන ඕනෑම වර්ගයේ ගොනුවක් මෙහි ප්‍රතිදානය වේ. නමුත් එම ගොනුව මෙම උසුලනයට සහය දක්වන ගොනුවක් විය යුතුය.

| | |
|---|---|
| src | ගොනු මාර්ගය ගොනු නාමය සහ ගොනු දිගුව ලබා දිය යුතුය |
| Width | දිග වෙනස් කිරීම |
| Height | උස වෙනස් කිරීම |
| loop | ශ්‍රව්‍ය/දෘශ්‍ය පටය නිමවීමෙන් පසුව නැවත ඉබේම ක්‍රියාත්මක වීමට |
| hidden | ශ්‍රව්‍ය/දෘශ්‍ය පටය සඟවා ක්‍රියාත්මක වීමට |


උදාහරණ chapter_08 /embed_Example.html

```
<html>
    <head>
        <title> embed tag-Example</title>
    </head>
    <body>
        <embed src=“data/video.mp4” loop=“true”>
    </body>
</html>
```

**ප්‍රතිඵලය** chapter_08 /embed_Example.html



අමතර plugin එකක් අවශ්‍යවීම සහ විවිධ browser මෙම උසුලනයට ප්‍රතිචාර දක්වන ආකාරය විවිධ වීම නිසා වර්තමානයේ මෙම උසුලනය එතරම් ප්‍රායෝගිකව භාවිතා නොවේ.




මෙම හේතුව නිසාම නව විශය නිර්දේශය තුල මෙම උසුලනය පිළිබඳව පැහැදිලි කිරීමට බලාපොරොත්තු නොවේ.

# වීඩියෝ ගොනුවක් යෙදීම

Embed උසුලනයේ සියළු දෝශ වලට පිළියමක් ලෙස HTML 5 සංස්කරණය මඟින් උසුලන කිහිපයක් හදුන්වා දී ඇත.
ඒ අතර වීඩියෝ ගොනුවක් ආදේශ කිරීමට video උසුලනය යොදා ගත යුතුය.

| | |
|---|---|
| src | ගොනු මාර්ගය ගොනු නාමය සහ ගොනු දිගුව ලබා දිය යුතුය |
| Width | දිග වෙනස් කිරීම |
| Height | උස වෙනස් කිරීම |
| loop | දෘශ්‍ය පටය නිමවීමෙන් පසුව නැවත ඉබේම ක්‍රියාත්මක වීමට |
| Controls | play , pause , volume සහිත toolbar එකතු දර්ශනය කර ගැනීමට |
| Poster | ධාවනය කිරීමට පෙර පෙන්වන පින්තූරය (cover photo) යෙදීම. |
| Autoplay | ආරම්භයේ දෘශ්‍ය පටය ඉබේ ක්‍රියාත්මක වීම. |

මෙම උසුලනය HTML 5 වර්ගයට අයත් වන නිසා ඇතැම් උපලක්ෂණ යෙදීමෙදී අගයක් ආදේශ කිරීම අනිවාර්ය නොවේ. Controls සහ loop යනු එවැනි උපලක්ෂණ දෙකකි එම උපලක්ෂණ දෙක පහත උදාහරණයේදී අගයන් ආදේශයකින් තොරව යොදා ඇත.

උදාහරණ chapter_08 /video.html

```
<html>
    <head>
        <title> video-Example</title>
    </head>
    <body>
        <video src = “data/video.mp4” controls loop>
    </body>
</html>
```

**ප්‍රතිඵලය** chapter_08 /video.html



මෙහි Controls කොටස නොයොදා ක්‍රියාත්මක කලේ නම් පහත දැක්වෙන Toolbar කොටස නොලැබේ.




මෙහි Poster යන උපලක්ෂණය ට පින්තූරය පවතින ස්ථානය පින්තූරයේ නම සහ ගොනු දිගුව ලබා දුන් විට එම පින්තූරය වීඩියෝ ගොනුව ධාවනය කිරීමට පෙර (cover photo ලෙස) යෙදී පවතී.

**උදාහරණ** chapter_08 /video_poster.html

```
<html>
    <head>
        <title> video poster-Example</title>
    </head>
    <body>
        <video src = “data/video.mp4” poster = “data/cover.jpg”
        controls>
    </body>
</html>
```

**ප්‍රතිඵලය** chapter_08 /video_poster.html



# ශ්‍රව්‍ය ගොනුවක් යෙදීම


ශ්‍රව්‍ය ගොනුවක් ආදේශ කිරීමට audio උසුලනය යොදා ගත යුතුය.ඩ

| | |
|---|---|
| src | ගොනු මාර්ගය ගොනු නාමය සහ ගොනු දිගුව ලබා දිය යුතුය |
| loop | ශ්‍රව්‍ය පටය නිමවීමෙන් පසුව නැවත ඉබේම ක්‍රියාත්මක වීමට |
| Controls | play , pause , volume සහිත toolbar එකතු දර්ශනය කර ගැනීමට |
| Autoplay | ආරම්භයේ දෘශ්‍ය පටය ඉබේ ක්‍රියාත්මක වීම. |

**උදාහරණ** chapter_08 / audio.html

```
<html>
    <head>
        <title> audio-Example</title>
    </head>
    <body>
        <audio src = “data/Sound.mp3” controls autoplay loop>
    </body>
</html>
```

**ප්‍රතිඵලය** chapter_08 / audio.html



# 09

# පසුතලය සැකසීම

- පසුතලයට වර්ණයක් යෙදීම
- පසුතලයට පින්තූරයක් යෙදීම


# පසුතලයට වර්ණයක් යෙදීම

මෙය වෙබ් පිටුවේ පසුබිමට සිදුකරන වෙනස් කිරීමක් නිසා මෙහිදී body උසුලනය තුල උපලක්ෂණ යෙදීම සිදුකරයි.
මේ සදහා body උසුලනය තුළ bgcolor නම් උපලක්ෂණ භාවිතා කරයි.

උදාහරණ chapter_09 /bg_color.html

```
<html>
    <head>
        <title> bg color-Example</title>
    </head>
    <body bgcolor = "#6666FF">
        <h1> This background is sky blue </h1>
    </body>
</html>
```

ප්‍රතිඵලය chapter_09 /bg_color.html




# පසුතලයට පින්තූරයක් යෙදීම

මේ සඳහා body උසුලනය තුළ background නම් උපලක්ෂණ භාවිතා කරයි.
background = පින්තූරයේ මාර්ගය ගොනු නාමය හා ගොනු දිගුව ලබා දිය යුතුය.

උදාහරණ chapter_09 /bg_image.html

```
<html>
    <head>
        <title> bg image-Example</title>
    </head>
    <body background = “data/bgpic.jpg”>
        <font color = “yellow”>
        <h1> This background is filled up with image.</h1>
        </font>
    </body>
</html>
```

ප්‍රතිඵලය chapter_09 /bg_image.html



# 10

# Marquee උසුලනය

- Marquee උසුලනයේ උපලක්ෂණ
- චලනය වන දිශාව
- හැසිරීම වෙනස් කිරීම
- චලනය වන වේගය

මෙම උසුලනයේ ක්‍රියාකාරීත්වය ග්‍රන්ථයක් මගින් දැක්වීම අපහසු වේ. නමුත් මෙම ග්‍රන්ථය සමඟ ඇති ප්‍රායෝගික උදාහරණ එකතුවේ 10 පරිච්ඡේදය යටතේ ඇති HTML ගොනු ධාවනය කර බැලීමෙන් මේ පිළිබඳව නිවරදි අවබෝධයක් ලබා ගැනීමට හැකියාව ලැබෙනු ඇත. ප්‍රායෝගික උදාහරණ ගොනුව පිළිබඳ තොරතුරු ග්‍රන්ථය ආරම්භයේ 06 වන පිටුවේ සඳහන්ව ඇත.

<< 06 වන පිටුව වෙත ගමන් කරන්න

## Marquee උසුලනයේ උපලක්ෂණ

වෙබ් පිටුවේ පවතින දේ චලනය කිරීම සඳහා marquee උසුලනය භාවිතා කළ හැක. මේ සමඟ පහත උපලක්ෂණ භාවිතා කළ හැක.

| | |
|---|---|
| Direction | චලනය විය යුතු දිශාව |
| Behavior | හැසිරිය යුතු ආකාරය |
| Scrolldelay | චලනය විය යුතු වේගය (වැඩි අගයක් දුන් විට හෙමින් ක්‍රියාත්මක වේ.) |
| Scrollamount | චලනය විය යුතු වේගය (වැඩි අගයක් දුන් විට වේගයෙන් ක්‍රියාත්මක වේ.) |
| Width | චලනය විය යුතු පළල ප්‍රතිශතයක් ලෙස |
| Heigth | චලනය විය යුතු උස ප්‍රතිශතයක් ලෙස |
| Loop | චලනය විය යුතු වාර ගනන |
| Bgcolor | චලනය වන කොටසේ පසුබිම් වර්ණය |
| Hspace | චලනය විය යුතු උස දෙපසින් ප්‍රතිශතයක් ලෙස |
| Vspace | චලනය විය යුතු පළල දෙපසින් ප්‍රතිශතයක් ලෙස |

## චලනය වන දිශාව

චලනය වන දිශාව වෙනස් කිරීම සඳහා marquee උසුලනය යටතේ භාවිතා කළ හැක Direction උපලක්ෂණය භාවිතා කළ හැක. මෙයට right , up , down , left ලෙස අගයන් වෙනස් කල හැක. එමගින් පිළිවෙලින් දකුණට ඉහළට පහළට වමට වන පරිදි චලනය වීම සිදුවේ. මේ සඳහා අගයක් ලබා නොදුන් විට left අවස්ථාවේ පවතී.

උදාහරණ chapter_10 /marquee_direction.html

```
<html>
    <head>
        <title> marquee direction-Example</title>
    </head>
    <body>
        <marquee> This is example of marquee </marquee>
        <marquee derection = “right”> This is example of marquee
        </marquee>
    </body>
</html>
```

ප්‍රතිඵලය chapter_10 /marquee_direction.html

```
    This is example of marquee
                                     This is example of marquee
```

## හැසිරීම වෙනස් කිරීම

හැසිරීම වෙනස් කිරීම සඳහා marquee උසුලනය යටතේ Behavior උපලක්ෂණය භාවිතා කළ හැක. මෙයට යෙදිය හැකි අගයන් පහත පරිදි වේ. මේ සඳහා අගයක් ලබා නොදුන් විට scroll අවස්ථාවේ පවතී.

| | |
|---|---|
| scroll | දිගින් දිගට එකම අතට චලනය වේ |
| slide | එක්වරක් චලනය වී මුල් පිහිටුමේ නතර වේ |
| alternate | දිගින් දිගට දෙපසට චලනය වේ |

උදාහරණ chapter_10 /marquee_Behavior.html

```
<html>
    <head>
        <title> marquee Behavior-Example</title>
    </head>
    <body>
        <marquee Behavior = alternate> This is example of marquee
        </marquee>
    </body>
</html>
```

ප්‍රතිඵලය chapter_10 /marquee_Behavior.html

This is example of marquee

## චලනය වන වේගය

චලනය වන වේගය වෙනස් කිරීම සඳහා marquee උසුලනය යටතේ Scrollamount සහ Scrolldelay උපලක්ෂණ භාවිතා කළ හැක. Scrollamount මඟින් චලනය විය යුතු වේගය වෙනස් කළ හැක. Scrolldelay මඟින් චලනයේ ප්‍රමාදය වෙනස් කළ හැක. ඒ අනුව Scrollamount අගය වැඩි කිරීම මඟින් චලනය වන වේගය වැඩි කළ හැක. Scrolldelay අගය වැඩි කිරීම මඟින් චලනය වන වේගය අඩු කළ හැක.

උදාහරණ chapter_10 /marquee_Scrollamount&Scrolldelay.html

```
<html>
    <head>
        <title> marquee Scrollamount&Scrolldelay-Example</title>
    </head>
    <body>
        <marquee Scrollamount = 100> This is example of marquee
        Scrollamount </marquee>
        <marquee Scrolldelay = 10> This is example of marquee
        Scrolldelay </marquee>
    </body>
</html>
```

ප්‍රතිඵලය chapter_10 /marquee_Scrollamount&Scrolldelay.html

```
This is example of marquee Scrollamount
                            This is example of marquee Scrolldelay
```

මෙම marquee උසුලනය මඟින් වචන පමණක් නොව වෙබ් පිටුව තුල පවතින ඡේද පින්තූර වැනි අංගද චලනය කළ හැක.

# 11

# HTML ලැයිස්තු

- පරිපාටිගත ලැයිස්තු.
- පරිපාටිගත නොවන ලැයිස්තු.
- නිර්වචන ලයිස්තු.

# පරිපාටිගත ලැයිස්තු.

මේ සඳහා ol උසුලනය භාවිතා වේ. ol යනු Ordered List යන්න කෙටිකර දැක්වීමකි ඒ යටතේ දත්ත යෙදීමට li උසුලනය භාවිතා කළ යුතුය.

**ව්‍යුහය**

<ol> ← ලැයිස්තුව ආරම්භය

<li> පළමු අයිතමය </li>

<li> දෙවන අයිතමය </li>

<li> තෙවන අයිතමය </li>

</ol> ← ලැයිස්තුව අවසානය

**උදාහරණ** chapter_11 /ordered_list.html

```
<html>
    <head>
        <title> Ordered List-Example </title>
    </head>
    <body>
        <ol>
            <li> RAM </li>
            <li> ROM </li>
            <li> ALU </li>
            <li> CU  </li>
        </ol>
    </body>
</html>
```

ප්‍රතිඵලය chapter_11 /ordered_list.html

1. RAM
2. ROM
3. ALU
4. CU

මෙහිදී ලැයිස්තුව 1 2 3 වශයෙන් අංක යෙදී සකස් වීම සිදුවේ. මෙය ආකාර කීපයකට වෙනස් කිරීම කළ හැක. එම ආකාර පහත දක්වා ඇති උදාහරණ කීපයකින් පැහැදිලි කර ඇත.
මේ සඳහා ol උසුලනය යටතේ type උපලක්ෂණය යොදා ගත යුතුය. type උපලක්ෂණයට විවිධ අගයන් යෙදීමේදී සිදුවන වෙනස්කම පිළිබඳව පහත උදාහරණ සැළකීමෙන් අවබෝධ කර ගත හැක.

උදාහරණ chapter_11 /ordered_list_type_A.html

```
<html>
    <head>
        <title> Ordered List type A-Example </title>
    </head>
    <body>
        <ol type = “A”>
            <li> RAM </li>
            <li> ROM </li>
            <li> ALU </li>
            <li> CU  </li>
        </ol>
    </body>
</html>
```

**ප්‍රතිඵලය** chapter_11 /ordered_list_type_A.html

A. RAM

B. ROM

C. ALU

D. CU

**උදාහරණ** chapter_11 /ordered_list_type_a.html

```
<html>
    <head>
        <title> Ordered List type a-Example </title>
    </head>
    <body>
        <ol type = “a”>
            <li> RAM </li>
            <li> ROM </li>
            <li> ALU </li>
            <li> CU  </li>
        </ol>
    </body>
</html>
```

**ප්‍රතිඵලය** chapter_11 /ordered_list_type_a.html

a. RAM

b. ROM

c. ALU

d. CU

උදාහරණ chapter_11 /ordered_list_type_I.html

```
<html>
    <head>
        <title> Ordered List type I-Example </title>
    </head>
    <body>
        <ol type = “I”>
            <li> RAM </li>
            <li> ROM </li>
            <li> ALU </li>
            <li> CU  </li>
        </ol>
    </body>
</html>
```

ප්‍රතිඵලය chapter_11 /ordered_list_type_I.html

```
I.   RAM
II.  ROM
III. ALU
IV.  CU
```

උදාහරණ chapter_11 /ordered_list_type_i.html

```
<html>
    <head>
        <title> Ordered List type i-Example </title>
    </head>
    <body>
        <ol type = "i">
            <li> RAM </li>
            <li> ROM </li>
            <li> ALU </li>
            <li> CU  </li>
        </ol>
    </body>
</html>
```

ප්‍රතිඵලය chapter_11 /ordered_list_type_i.html

```
i.   RAM
ii.  ROM
iii. ALU
iv.  CU
```

Type යන්නට භාවිතා නොකොට එනම් එයට අගයක් ආදේශ නොකළ විට එහි අගය ඉබේම 1 අවස්ථාවේ පවතී.

මෙහිදී දත්ත 1 සිට පිළිවෙළට අංක ගැන්වේ. මෙය අපට අවශ්‍ය ඉලක්කමේ සිට ආරම්භ වීමට start උපලක්ෂණට අවශ්‍ය අගය ආදේශ කළ යුතුය.
එක් අයිතමයක පමනක් අගය වෙනස් කිරීම සඳහා value උපලක්ෂණ සඳහා අගය ආදේශ කළ යුතුය.

උදාහරණ chapter_11 /ordered_list_start&value.html

```
<html>
    <head>
        <title> Ordered List start & value-Example </title>
    </head>
    <body>
        <ol start = 5>
            <li> RAM </li>
            <li> ROM </li>
            <li value = 20> ALU </li>
            <li> CU  </li>
        </ol>
    </body>
</html>
```

ප්‍රතිඵලය chapter_11 /ordered_list_start&value.html

```
5.   RAM
6.   ROM
20.  ALU
21.  CU
```

ඒ අනුව මෙම ලැයිස්තුව 5 සිට ආරම්භ වී ඇති අතර ALU හි අගයද 20 ලෙස වෙනස් වී ඇත. නමුත් මෙහිදී එක් විශේෂත්වයක් සිදුවේ එනම් value උපලක්ෂණ යොදා අගය වෙනස් කළ පසු එතැන් සිට පවතින සියළුම අයිතමවල අගයන්ද වෙනස් වේ. එනම් මෙම ලැයිස්තුවේ අගට තවත් අයිතමක් එක් කලේ නම් එහි අගය 22 වනු ඇත.

# පරිපාටිගත නොවන ලැයිස්තු.

මේ සඳහා ul උසුලනය භාවිතා වේ.මෙහි ul යනු unordered list යන්න කෙටිකර දැක්වීමකි ඒ යටතේ දත්ත යෙදීමට පෙර පරිදිම li උසුලනය භාවිතා කළ යුතුය.

**උදාහරණ** chapter_11 /unordered_list.html

```
<html>
    <head>
        <title> Unordered List-Example </title>
    </head>
    <body>
        <ul>
            <li> RAM </li>
            <li> ROM </li>
            <li> ALU </li>
            <li> CU  </li>
        </ul>
    </body>
</html>
```

**ප්‍රතිඵලය** chapter_11 /unordered_list.html

- RAM
- ROM
- ALU
- CU

මෙහිදී ලැයිස්තුව bullets යෙදී සකස් වීම සිදුවේ. මෙම bullets වල ස්වරූපයද ආකාර කීපයකට වෙනස් කිරීම කළ හැක. එම ආකාර පහත දක්වා ඇති උදාහරණ කීපයකින් දක්වා ඇත.

මේ සඳහා පෙර පරිදිම ul උසුලනය යටතේ type උපලක්ෂණය යොදා ගත යුතුය. type උපලක්ෂණයට විවිධ අගයන් යෙදීමේදී සිදුවන වෙනස්කම පිළිබඳව පහත උදාහරණ සැලකීමෙන් අවබෝධ කර ගත හැක.

උදාහරණ chapter_11 /unordered_list_type_circle.html

```
<html>
    <head>
        <title> unordered List type-circle-Example </title>
    </head>
    <body>
        <ul type = “circle”>
            <li> RAM </li>
            <li> ROM </li>
            <li> ALU </li>
            <li> CU  </li>
        </ul>
    </body>
</html>
```

ප්‍රතිඵලය chapter_11 /unordered_list_type_circle.html

- RAM
- ROM
- ALU
- CU

උදාහරණ chapter_11 /unordered_list_type_square.html

```
<html>
    <head>
        <title> unordered List type-square-Example </title>
    </head>
    <body>
        <ul type = “square”>
            <li> RAM </li>
            <li> ROM </li>
            <li> ALU </li>
            <li> CU  </li>
        </ul>
    </body>
</html>
```

ප්‍රතිඵලය chapter_11 /unordered_list_type_square.html

- RAM
- ROM
- ALU
- CU

Type යන්නට භාවිතා නොකොට එනම් එයට අගයක් ආදේශ නොකළ විට එහි අගය ඉබේම disk අවස්ථාවේ පවතී.

# නිර්වචන ලයිස්තු.

මෙහිදී දත්ත වර්ගීකරණය කරමින් දැක්විය හැක. එනම් මුලින් ප්‍රධාන දත්තයක් ලබා දී ඉන්පසු ඒ යටතේ එය විස්තර කිරීමට උපදත්ත ලබා දිය හැක.
මේ සදහා dl උසුලනය භාවිතා වේ. ඒ යටතේ ප්‍රධාන දත්ත යෙදීමට dt උසුලනයද උපදත්ත යෙදීමට dd උසුලනයද භාවිතා කළ යුතුය. මෙහිදී අංක හෝ සලකුණු නොයෙදේ.
මේ පිළිබඳව අවබෝධයක් ලබා ගැනීමට පහත ව්‍යුහය සලකන්න.

**ව්‍යුහය**

```
<dl>          ← ලැයිස්තුව ආරම්භය
    <dt> පළමු මාතෘකාව </dt>
        <dd> පළමු මාතෘකාව යටතේ පළමු අයිතමය </dd>
        <dd> පළමු මාතෘකාව යටතේ දෙවන අයිතමය </dd>
    <dt> දෙවන මාතෘකාව </dt>
        <dd> දෙවන මාතෘකාව යටතේ පළමු අයිතමය </dd>
        <dd> දෙවන මාතෘකාව යටතේ දෙවන අයිතමය </dd>
</dl>         ← ලැයිස්තුව අවසානය
```

පහත උදාහරණයේ RAM යන ප්‍රධාන දත්තය යටතේ එය විස්තර කිරීමට S-RAM , D-RAM ලබාදී ඇත.ROM යන ප්‍රධාන දත්තය යටතේ එය විස්තර කිරීමට PROM , EPROM , EEPROM ලබාදී ඇත.

උදාහරණ chapter_11 /Definition_List.html

```
<html>
    <head>
        <title> Definition List-Example </title>
    </head>
    <body>
        <dl>
            <dt>RAM</dt>
                <dd>S-RAM</dd>
                <dd>D-RAM</dd>
            <dt>ROM</dt>
                <dd>PROM</dd>
                <dd>EPROM</dd>
                <dd>EEPROM</dd>
        </dl>
    </body>
</html>
```

ප්‍රතිඵලය chapter_11 /Definition_List.html

```
RAM
    S-RAM
    D-RAM
ROM
    PROM
    EPROM
    EEPROM
```

මෙම වගු ක්‍රම කිහිපයක් මිශ්‍රව භාවිතා කළ හැක. පහත උදාහරණයේ පරිපාටිගත ලැයිස්තුවේ පළමු අයිතමයෙන් පසුව නැවතත් පරිපාටිගත ලැයිස්තුවක් යොදා ඇත. ඉන් පසු දෙවන අයිතමයෙන් පසුව පරිපාටිගත නොවන ලැයිස්තුවක් යොදාඇත.

**උදාහරණ** chapter_11 /All_In_One(list).html

```
<html>
    <head>
        <title> All In One (list)-Example </title>
    </head>
    <body>
        <ol>
            <li> RAM </li>
                <ol type="a">
                    <li> S-RAM </li>
                    <li> D-RAM </li>
                </ol>
            <li> ROM </li>
                <ul>
                    <li> PROM </li>
                    <li> EPROM </li>
                    <li> EEPROM </li>
                </ul>
        </ol>
    </body>
</html>
```

**ප්‍රතිඵලය** chapter_11 /All_In_One(list).html

1. RAM
    a. S-RAM
    b. D-RAM
2. ROM
    - PROM
    - EPROM
    - EEPROM

# 12

# HTML වගු


- වගු සෑදීමෙදී අවශ්‍ය වන උසුලන
- වගුවක ව්‍යුහය
- වගු නිර්මාණය සඳහා වන උසුලන පෙළගැසීමේ ව්‍යුහය
- සරල වගුවක් නිර්මාණය
- වගුවක මාතෘකාව
- වගු තීරුවක මාතෘකාව
- මිශ්‍ර වගු නිර්මාණ

## වගු සෑදීමෙදී අවශ්‍ය වන උසුලන

වෙබ් පිටුවකට වගුවක් ඇතුලත් කර ගැනීම සඳහා අවශ්‍ය වන උසුලන කීපයක් ඇති අතර ඒවා පහත වගුවෙන් දක්වා ඇත

| | |
|---|---|
| Table | වගුවේ ආරම්භය |
| tr | වගුවට පේළියක් එකතු කිරීම |
| td | වගුවේ පේළියට තීරු එක් කිරීම |
| caption | වගුවට මාතෘකාවක් යෙදීම |
| th | වගුවේ තීරුවට මාතෘකාවක් එක් කිරීම |
| Colspan | වගුවේ තීරු කිහිපයක් එක් කිරීමට |
| rowspan | වගුවේ පේළි කිහිපයක් එක් කිරීමට |

## වගුවක ව්‍යුහය



# වගු නිර්මාණය සඳහා වන උසුලන පෙළගැසීමේ ව්‍යුහය

## ව්‍යුහය

```
<table>

    <tr> වගුවේ පළමු තිරස් පේළිය

        <td> පළමු තිරස් පේළිය යටතේ පළමු තීරුව </td>

        <td> පළමු තිරස් පේළිය යටතේ දෙවන තීරුව </td>

    </tr> වගුවේ පළමු තිරස් පේළියේ අවසානය

    <tr> වගුවේ දෙවන තිරස් පේළිය

        <td> දෙවන තිරස් පේළිය යටතේ පළමු තීරුව </td>

        <td> දෙවන තිරස් පේළිය යටතේ දෙවන තීරුව </td>

    </tr> වගුවේ දෙවන තිරස් පේළියේ අවසානය

</table>
```

# සරල වගුවක් නිර්මාණය

උදාහරණ chapter_12 /table.html

```
<html>
    <head>
        <title> table-Example </title>
    </head>
    <body>
        <table border = 1>
            <tr>
                <td> Name </td>
                <td> ID </td>
            </tr>
            <tr>
                <td> Kavindu </td>
                <td> 0012456 </td>
            </tr>
            <tr>
                <td> Ravindu </td>
                <td> 0023456 </td>
            </tr>
        </table>
    </body>
</html>
```

මෙහි table හි උපලක්ෂණයක් වන border = 1 යොදා ඇත්තේ border උපලක්ෂණයට අගයක් ආදේශ නොකර එනම් <table> ලෙස පමනක් යොදා වෙබ් පිටුව නිර්මාණය කළවිට ඇතැම් අවස්ථාවන් හීදී වගුව නිර්මාණය වී ඇති රේඛා දර්ශණය නොවීමට ඉඩ ඇති බැවිනි.

ප්‍රතිඵලය chapter_12 /table.html

| | |
|---|---|
| Name | ID |
| Kavindu | 0012456 |
| Ravindu | 0023456 |

## වගුවක මාතෘකාව

උදාහරණ chapter_12 /table_caption.html

```
<html>
     <head>
          <title> table caption-Example </title>
     </head>
     <body>
          <table border = 1>
          <caption> Student Data </caption>
               <tr>
                    <td> Name </td>
                    <td> ID </td>
               </tr>
               <tr>
                    <td> Kavindu </td>
                    <td> 0012456 </td>
               </tr>
          </table>
     </body>
</html>
```

මෙහිදී table උසුලනයෙන් පසුව caption උසුලනය යටතේ වගුවට අවශ්‍ය මාතෘකාව ලබා දිය යුතුය.

ප්‍රතිඵලය chapter_12 /table_caption.html

Student Data

| Name | ID |
|---|---|
| Kavindu | 0012456 |

## වගු තීරුවක මාතෘකාව

මෙහිදී මාතෘකාවක් ලෙස යෙදිය යුතු කොටසේ td වෙනුවට th ලෙස යෙදිය යුතුය. එවිට එම අක්ෂර තද පැහැගැන්වී වගුවේ මැදට ස්ථානගතවී දර්ශණය වීම සිදුවේ.

උදාහරණ chapter_12 /table_head.html

```
<html>
    <head>
        <title> table head-Example </title>
    </head>
    <body>
        <table border = 1>
        <caption> Student Data </caption>
            <tr>
                <th> Name </th>
                <th> ID </th>
            </tr>
```

```
                <tr>
                    <td> Kavindu </td>
                    <td> 0012456 </td>
                </tr>
                <tr>
                    <td> Ravindu </td>
                    <td> 0023456 </td>
                </tr>
            </table>
        </body>
</html>
```


ප්‍රතිඵලය chapter_12 /table_head.html

Student Data

| Name | ID |
|---|---|
| Kavindu | 0012456 |
| Ravindu | 0023456 |

# මිශ්‍ර වගු නිර්මාණ

මෙතෙක් අප භාවිතා කළ සරල වගු නිර්මාණ කිරීමේ ක්‍රමවේද වල සිට සංකීර්ණ ක්‍රමවේද වෙත යාමට දැන් උත්සහ කරමු. මෙම ක්‍රම තරමක් සංකීර්ණ නිසා ඉතා හොඳින් අධ්‍යනය කර ඒවායේ ක්‍රියාකාරීත්වය නිවරදිව වටහා ගැනීමට උත්සහ කරන්න.
පහත වගුවේ ව්‍යුහය හොඳින් අධ්‍යනය කරන්න.




මෙහි පළමු පේළියේ පළමුතීරුව හා දෙවන තීරුව එක්වී ඇත.එනම් මෙහි පළමු තිරස් පේළියේ කොටු 1ක්ද දෙවන තිරස් පේළියේ කොටු 2ක් ද ඇත.පළමු පේළියේ පළමු තීරුවේ කොටුව **දකුණු පසට කොටු දෙකක් අයත් කර ගෙන මිශ්‍ර කොටුවක්** සාදාගෙන ඇත. මෙය HTML තුළ නිර්මාණ කර ගැනීමට colspan නම් උපලක්ෂණය භාවිතා වේ.මෙමඟින් සිදුවී ඇත්තේ තීරු හෙවත් column දෙකක් එක් වීමයි එම නිසා මෙය colspan ලෙස හඳුන්වයි

**ව්‍යුහය**

<td colspan = දකුණු පසට අයත්කර ගත යුතු කොටු සංඛ්‍යාව >

මීළඟ උදාහරණයේදී එවැනි වගුවක් නිර්මාණය කරන ආකාරය සලකා බලමු.


**උදාහරණ** chapter_12 /table_colspan.html

```
<html>
    <head>
        <title> table colspan-Example </title>
    </head>
    <body>
        <table border = 1>
            <tr>
                <td colspan = 2> A </td>
            </tr>
            <tr>
                <td> B </td>
                <td> C </td>
            </tr>
        </table>
    </body>
</html>
```

**ප්‍රතිඵලය** chapter_12 /table_colspan.html

<table>
<tr><td colspan="2">A</td></tr>
<tr><td>B</td><td>C</td></tr>
</table>

මීළඟට අපි තවත් මිශ්‍ර වගු ව්‍යුහයක් පිළිබඳව අවදානය යොමු කරමු. පහත වගුවේ ව්‍යුහය හොඳින් අධ්‍යනය කරන්න.




මෙහි පළමු පේළියේ පළමු තීරුව දෙවන පේළියේ පළමු තීරුව සමඟ එක්වී ඇත.එනම් පළමු පේළියේ පළමු කොටුව දෙවන පේළියේ පළමු කොටුව සමඟ එක්වී **පහළට කොටු දෙකක් මිශ්‍ර වූ තනි කොටුවක්** සදාගෙන ඇත. එවිට එම මිශ්‍ර කොටුව අයත් වනුයේ පළමු පෙළියට වේ. එනම් පළමු තිරස් පේළියේ කොටු 2 ද දෙවන තිරස් පේළියේ කොටු 1 ද ඇත. මෙය HTML තුළ නිර්මාණ කර ගැනීමට rowspan නම් උපලක්ෂණය භාවිතා වේ. මෙමඟින් සිදුවී ඇත්තේ පේළි හෙවත් row දෙකක් එක් වීමයි එම නිසා මෙය rowspan ලෙස හදුන්වයි

**ව්‍යුහය**

<td rowspan = පහළට අයත්කර ගත යුතු කොටු සංඛ්‍යාව >

මීළඟ උදාහරණයේදී එවැනි වගුවක් නිර්මාණය කරන ආකාරය සලකා බලමු.

**උදාහරණ** chapter_12 /table_rowspan.html

```
<html>
    <head>
        <title> table rowspan-Example </title>
    </head>
    <body>
        <table border = 1>
            <tr>
                <td rowspan = 2> A </td>
                <td> B </td>
            </tr>
            <tr>
                <td> C </td>
            </tr>
        </table>
    </body>
</html>
```

**ප්‍රතිඵලය** chapter_12 /table_rowspan.html

<table>
<tr><td rowspan="2">A</td><td>B</td></tr>
<tr><td>C</td></tr>
</table>

මෙතෙක් අප භාවිතා කළ සරල වගු නිර්මාණ කිරීමේ ක්‍රමවේද සියල්ල එකතු කර ගනිමින් ප්‍රායෝගික වශයෙන් වැදගත් වන නිර්මාණයක් සිදුකරන ආකාරය පහත උදාහරණයෙන් දක්වා ඇත.

**උදාහරණ** chapter_12 /All_In_One(table).html

```
<html>
    <head>
        <title> All In One(table)-Example </title>
    </head>
    <body>
        <table border = 1>
            <tr>
                <th rowspan = 2> Name </th>
                <th colspan = 3> Date Of Birth </td>
            </tr>
            <tr>
                <th> DD </th>
                <th> MM </th>
                <th> YYYY </th>
            </tr>
            <tr>
                <td> Akila </td>
                <td> 02 </td>
                <td> 10 </td>
                <td> 1997 </td>
            </tr>
```

```
                <tr>
                     <td> Vikum </td>
                     <td> 19 </td>
                     <td> 04 </td>
                     <td> 1999 </td>
                </tr>
                <tr>
                     <td> Pathum </td>
                     <td> 22 </td>
                     <td> 12 </td>
                     <td> 1998 </td>
                </tr>
           </table>
      </body>
</html>
```

ප්‍රතිඵලය chapter_12 /All_In_One(table).html

| **Name** | **Date Of Birth** | | |
|---|---|---|---|
| | **DD** | **MM** | **YYYY** |
| Akila | 02 | 10 | 1997 |
| Vikum | 19 | 04 | 1999 |
| Pathum | 22 | 12 | 1998 |

# 13

# HTML රාමු

- රාමු හැඳින්වීම
- තිරස් රාමු
- සිරස් රාමු

# රාමු හැඳින්වීම

එකම වෙබ් පිටුවක වෙබ් පිටු කිහිපයක් දර්ශනය කර ගැනීමට රාමු භාවිතා කළ හැක. මෙහිදී සැබවින්ම සිදුවන්නේ වෙබ් පිටුව කොටස් කීපයකට වෙන් කර එම එක් එක් කොටසට අප මීට පෙර නිර්මාණය කළ වෙබ් පිටු ඇතුළත් කිරීමයි.
කෙසේ නමුත් මෙම ක්‍රමවේදයේ යම් දුර්වලතාවයන්ද පවතී එම නිසා මෙම ක්‍රමවේදය නව විෂය නිර්දේශයෙන් ඉවත් කොට ඇත
රාමු යෙදීම සඳහා frameset උසුලනය භාවිතා වේ. එමෙන්ම මෙම උසුලනය යෙදිය යුත්තේ head කොටසින් පසුවය. සැබැවින්ම frameset උසුලනය යොදා ගත් විට body යෙදීම අවශ්‍ය නොවේ එයට හේතුව වන්නේ frameset මඟින් පිටුව කොටස් කීපයකට වෙන් කර එම කොටස් තුල මීට පෙර අප නිර්මාණය කර ගත් වෙබ් පිටු දර්ශනය වීමට සැලැස්වීමයි. ඇත්ත වශයෙන්ම ගත් විට මෙහිදී අප නිර්මාණය කරන වෙබ් පිටුවට body කොටසක් නැත. body කොටස ලෙස පවතින්නේ මීට පෙර නිර්මාණය කර රාමු තුලට ආදේශ කරගත් වෙබ් පිටුය. නමුත් යම් හේතුවක් නිසා frameset නිසි පරිදි ක්‍රියා නොකර රාමු දර්ශනය නොවුනහොත් වෙබ් පිටුව හිස්ව දර්ශනය වේ එවැනි තත්වයකදී පරිශීලකට දර්ශනය විය යුතු දේ අවශ්‍ය නම් body කොටසක් තුල යොදා තැබිය හැක. එවිට noframes උසුලනය යටතේ body කොටස යෙදිය යුතුය. මේ සියල්ල පිළිබඳ නිවරදි අවබෝධයක් ඉදිරි ව්‍යුහයන් සහ උදාහරණ තුලින් ලැබෙනු ඇත.

# තිරස් රාමු

මෙහිදී වෙබ් පිටුව තිරස් අතට කොටස් කිහිපයකට වෙන් කිරීම සිදුවේ. මෙය හොඳින් අවබෝධකර ගැනීම සඳහා පහත ව්‍යුහයට අවධානය යොමුකරන්න.


ව්‍යුහය

```
<frameset rows="පළමු රාමුවේ ප්‍රමාණය,දෙවන රාමුවේ ප්‍රමාණය
තුන්වන රාමුවේ ප්‍රමාණය" >
    <frame src="පළමු රාමුවේ දර්ශනය විය යුතු වෙබ් පිටුව">
    <frame src="දෙවන රාමුවේ දර්ශනය විය යුතු වෙබ් පිටුව">
    <frame src="තුන්වන රාමුවේ දර්ශනය විය යුතු වෙබ් පිටුව">
    <noframes>
        <body>
            රාමු නිසි පරිදි ක්‍රියාත්මක නොවුනහොත් සාමාන්‍ය පරිදි පිටුවේ දර්ශනය
            විය යුතු දේ
        </body>
    </noframes>
</frameset>
```

**උදාහරණ** chapter_13 /frames_row.html

```
<html>
    <head>
        <title> Frames row-Example </title>
    </head>
    <frameset rows="20% , 80%">
        <frame src="Others/1st_frame.html">
        <frame src="Others/2nd_frame.html">
    <noframes>
        <body>
            Your browser does not support frames
        </body>
    </noframes>
    </frameset>
</html>
```

**ප්‍රතිඵලය** chapter_13 /frames_row.html



# සිරස් රාමු

මෙහිදී වෙබ් පිටුව සිරස් අතට කොටස් කිහිපයකට වෙන් කිරීම සිදුවේ. මෙය හොඳින් අවබෝධකර ගැනීම සඳහා පහත ව්‍යුහයට අවධානය යොමුකරන්න.

**ව්‍යුහය**


```
<frameset cols="පළමු රාමුවේ ප්‍රමාණය,දෙවන රාමුවේ ප්‍රමාණය
තුන්වන රාමුවේ ප්‍රමාණය" >
    <frame src="පළමු රාමුවේ දර්ශනය විය යුතු වෙබ් පිටුව">
    <frame src="දෙවන රාමුවේ දර්ශනය විය යුතු වෙබ් පිටුව">
    <frame src="තුන්වන රාමුවේ දර්ශනය විය යුතු වෙබ් පිටුව">
    <noframes>
        <body>
            රාමු නිසි පරිදි ක්‍රියාත්මක නොවුනහොත් සාමාන්‍ය පරිදි පිටුවේ දර්ශනය
            විය යුතු දේ
        </body>
    </noframes>
</frameset>
```

**උදාහරණ** chapter_13 /frames_cols.html

```
<html>
    <head>
        <title> Frames cols-Example </title>
    </head>
    <frameset cols="30% , 70%">
        <frame src="Others/1st_frame.html">
        <frame src="Others/2nd_frame.html">
```

```
    <noframes>
        <body>
            Your browser does not support frames
        </body>
    </noframes>
    </frameset>
</html>
```

ප්‍රතිඵලය chapter_13 /frames_cols.html




මෙහිදී රාමුවේ ප්‍රමාණය ප්‍රතිශතයක් ලෙස ලබා දී ඇත. එමෙන්ම එම අගය පික්සල් මගින්ද ලබා දිය හැක. නමුත් එවිට පිටුවේ ප්‍රමාණය පිළිබඳව නිවරදි අවබෝධයක් තිබිය යුතුය.

අවසාන වශයෙන් රාමු පිළිබඳ සඳහන් කිරීමෙදී දැක්විය යුතු වැදගත් කරුණක් ඇත. ඒ වර්ථමානයේ මෙම ක්‍රමය එතරම් භාවිතා නොවන බවයි. මෙයට හේතු ලෙස සෑම web browser (වෙබ් අතරික්සුවක්) තුලම මෙම ක්‍රමය නිවරදිව ක්‍රියා නොකිරීම රාමුවේ ප්‍රමාණය සමඟ වෙබ් පිටුවේ ප්‍රමාණය නොගැලපීම නිසා නිවරදිව වෙබ් පිටුවේ අන්තර්ගතය දර්ශණය නොවීම පිටුපසට යාමේ බොත්තම (back button) නිවරදිව ක්‍රියාත්මක නොවීම වැනි කරුණු පෙන්වා දිය හැක.

# 14


# HTML අධිසම්බන්ධක

- අධිසම්බන්ධයක වැදගත්කම
- අධිසම්බන්ධයක ව්‍යුහය
- අධිසම්බන්ධයක් නිර්මාණය
- පින්තූර සඳහා සම්බන්ධතාව ලබා දීම
- target උපලක්ෂණය

# අධිසම්බන්ධයක වැදගත්කම

එදිනෙදා වෙබ් අඩවි භාවිතා කිරීමේදී අප මේ මොහොතේ පරිශීලනය කරමින් සිටින වෙබ් අඩවියේ සිට තවත් වෙබ් අඩවියකට ගමන් කිරීමට සිදුවන අවස්ථා ඕනෑතරම් දැකිය හැක. වෙබ් අඩවිය පරිශීලන කරමින් සිටින අපගේ පහසුව සඳහා වෙබ් අඩවි නිර්මාණකරුවන් අප මේ මොහොතේ පරිශීලනය කරමින් සිටින වෙබ් අඩවියේ සිට අපට ගමන් කිරීමට අවශ්‍ය අනෙක් වෙබ් අඩවියට පහසුවෙන් ගමන් කළ හැකි කෙටි මාර්ග නිර්මාණය කර ඇත. මේවා අධිසම්බන්ධක ලෙස හඳුන්වයි. මෙම සම්භන්ධතාව බොහෝ විට වචනයකට හෝ වාක්‍ය ඛන්ඩයකට හෝ පින්තූරයකට යොදා තිබිය හැකි අතර එවිට එම වචනයමත හෝ වාක්‍ය ඛන්ඩයමත හෝ පින්තූරයමත click කිරීමෙන් එය සම්බන්ධ කර තිබූ වෙබ් පිටුවට ගමන් කළ හැක.

උදාහරණයක් ලෙස ගත් විට අප නිතර භාවිතා කරන Google වෙබ් අඩවිය තුල යමක් සෙවීම (Search) කළ විට ප්‍රතිඵලය ලෙස ලැබෙන්නේ අධිසම්බන්ධක රාශියකින් යුත් වෙබ් පිටුවකි.



## අධිසම්බන්ධයක ව්‍යුහය

**ව්‍යුහය**

< a href = ගමන් කළ යුතු වෙබ් පිටුවේ මාර්ගය සහ නම > සම්බන්ධතාව ලබා දුන් ස්ථානයට

පිවිසීමට click කළ යුතු වචනය </a>

අධිසම්බන්ධ නිර්මාණය සඳහා a උසුලනය භාවිතා වේ. ගමන් කළ යුතු වෙබ් පිටුවේ මාර්ගය සහ නම ලබා දීමට href උපලක්ෂණය යොදා ගත හැක.

## අධිසම්බන්ධයක් නිර්මාණය

**උදාහරණ** chapter_14 /hyperlink.html

```
<html>
    <head>
        <title> Hyperlink-Example </title>
    </head>
    <body>
        <a href = “Others/nextpage.html”> Next page </a> <br>
        <a href = “http://www.google.com”> Google </a>
    </body>
</html>
```

ඉහත උදාහරණය ක්‍රියාත්මක කිරීමට පෙර Others නම් folder තුළ nextpage.html නම් වෙබ් පිටුවක් නිර්මාණය කළ යුතුය.
මෙහි Others නම් folder එක අප නිර්මාණය කරන වෙබ් පිටුව එනම් hyperlink.html සමඟම පැවතිය යුතු අතර එයට හේතුව සහ ගොනු මාර්ගය තෝරා ගැනීම පිළිබඳව නිවරදි අවබෝධයක් නොමැති නම් අවසාන පරිච්ඡේදය අධ්‍යනය කිරීමෙන් ඒ පිළිබඳව අවබෝධයක් ලබා ගත හැක.


අතිරේක කියවීම් වෙත ගමන් කරන්න >>

**ප්‍රතිඵලය** chapter_14 /hyperlink.html


[Next page]

[Google]

මෙහි Next Page මත click කළ විට Others නම් folder තුල nextpage.html නම් වෙබ් පිටුව දර්ශනය වේ.




මෙහි Google මත click කළ විට Google වෙබ් අඩවියේ නිවස්න පිටුව (home page) දර්ශනය වේ. ඒ සඳහා ඔබගේ පරිගණකයට අන්තර්ජාල සම්බන්ධතාවක් සපයා තිබීම අනිවාර්යය වේ.



# පින්තූර සඳහා සම්බන්ධතාව ලබා දීම

මීට පෙර උදාහරණ වලදී අප සම්බන්ධතාව ලබා දුන්නේ වචන සඳහා ය. නමුත් වර්තමානයේ බොහෝ වෙබ් අඩවි වල පින්තූර සඳහාද සම්බන්ධතාව ලබා දී ඇත. එමඟින් වෙබ් අඩවිය අලංකාරවීමක් මෙන්ම පරිශීලකගේ ආකර්ෂණය දිනාගැනීමක්ද සිදුවේ.
පින්තූර සඳහා සම්බන්ධතාව ලබා දීමේදී අප මීට පෙර භාවිතා කළ ව්‍යුහයම භාවිතා කළ යුතුය. මෙහිදී අවධානය යොමුකළ යුතු කරුණ වන්නේ ඉහත උදාහරණ වලදී සම්බන්ධතාව ලබා දුන් ස්ථානයට පිවිසීමට click කළ යුතු වචනය වෙනුවට පින්තූරය යෙදීමයි. මීට පෙර පරිච්ඡේදයකදී පින්තූර යොදන ආකාරය අප අධ්‍යනය කර ඇත.

<< 8 වන පරිච්ඡේදය වෙත ගමන් කරන්න


උදාහරණ chapter_14 /image_hyperlink.html

```
<html>
    <head>
        <title> Image Hyperlink-Example </title>
    </head>
    <body>
        <a href = “http://www.google.com”>
        <img src = “data/pic.png” border = 10>
        </a>
    </body>
</html>
```

ප්‍රතිඵලය chapter_14 /image_hyperlink.html



මෙහි පින්තූරය මත click කළ විට පෙර මෙන්ම Google වෙබ් අඩවියේ නිවස්න පිටුව (home page) දර්ශනය වේ. ඒ සඳහා ඔබගේ පරිගනකයට අන්තර්ජාල සම්බන්ධතාවක් සපයා තිබීම අනිවාර්යය වේ.



# target උපලක්ෂණය

මෙහිදී සම්බන්ධතාවය ලබාදුන් ගොනුව හෝ වෙබ් පිටුව විවෘත වන්නේ අප භාවිතා කරමින් සිටි පටිත්ත (tab) තුලම වේ. එමනිසා අප භාවිතා කරමින් සිටි වෙබ්පිටුව මගහැරියයි. මෙය බොහෝ විට අවධානය යොමු නොවන කරුණක් වුවද ඇතැම් අවස්ථාවන් වල මෙය පරිශීලකට අපහසුතාවක් ඇතිකරනු ඇත.
මෙයට විසදුමක් ලෙස target උපලක්ෂණය හඳුන්වාදිය හැක. ඒ සමඟ යෙදිය හැකි අගයන් කිහිපයක් පහත දැක්වේ.


| | |
|---|---|
| _blank | සම්බන්ධ කළ වෙබ් පිටුව නව tab එකකින් විවෘත වේ |
| _self | සම්බන්ධ කළ වෙබ් පිටුව එම රාමුවේම විවෘත වේ |
| _top | රාමු සහිත වෙබ් පිටුවක සියළු රාමු ඉවත්වී සම්බන්ධ කළ වෙබ් පිටුව සම්පූර්ණ පිටුවක් ලෙස විවෘත වේ |

මෙහි _self සහ _top යන අගයන් යෙදිය හැක්කේ රාමු යොදා ඇත්නම් පමනි.


උදාහරණ chapter_14 /hyperlink_target.html


```
<html>
    <head>
        <title> Hyperlink Target-Example </title>
    </head>
    <body>
        <a href =“Others/nextpage.html” target =“_blank”>
        Next page
        </a>
    </body>
</html>
```

## ප්‍රතිඵලය chapter_14 /hyperlink_target.html




මෙහි Next Page මත click කළ විට වෙබ් පිටුව නව tab එකකින් විවෘත වේ.




# 15

# HTML ෆෝරම(form)

- ෆොරමයක භාවිතය සහ වැදගත්කම
- වදන් ඇතුළත් කිරීම
- මුරපද ඇතුළත් කිරීම
- පේළි කිහිපයක වාක්‍ය ඇතුළත් කිරීම
- තෝරාගැනීම් කිහිපයක් එකවර සිදුකිරීම
- තෝරාගැනීම් කිහිපයකින් එකක් තෝරාගැනීම
- දත්ත ඇදහැලීමේ ලැයිස්තු
- බොත්තම් ඇතුළත් කිරීම
- දත්ත කාණ්ඩ කිරීම
- අමතර ඇතුළත් කිරීම්
- දත්ත වෙනත් ස්ථානයකට ගෙනයාම

# ෆොරමයක භාවිතය සහ වැදගත්කම

අන්තර්ජාලයේ බොහෝ අවස්ථාවල වෙබ් පිටුව භාවිතා කරන්නන්ගේ තොරතුරු ඇතුළත් කිරීමට වෙබ් ෆෝරම භාවිතා කරයි. උදාහරණයක් ලෙස පහත වෙබ් පිටුව සලකන්න.




මෙවැනි වෙබ් ෆෝරම වල මූලික අරමුණ වන්නේ පරිශීලකගෙන් දත්ත එක්රැස් කර වෙබ් සේවාදායක් තුල තැන්පත් කිරීම හෝ වෙනත් වෙබ් පිටුවකට ගෙන යාම වැනි කරුණු වේ.
මෙවැනි ෆෝරම නිර්මාණය කිරීමේදී බහුලව භාවිතාවන උසුලන ලෙස form සහ input හදුන්වාදිය හැක.

| | |
|---|---|
| from | ෆෝරමය ආරම්භ කිරීම |
| input | එක් එක් වර්ගයේ දත්ත ඇතුලත් කිරීමේ දී මෙම උසුලනය භාවිතා කළ යුතුය මෙහිදී මෙම උසුලනය යටතේ ලබා දෙන type උපලක්ෂණය මගින් ඇතුලත් කළ යුතු දත්ත වර්ගය තෝරා ගත හැක |

එමෙන්ම මෙහිදී භාවිතා වන උපලක්ෂණ දෙකක් වන name සහ value පිළිබඳව සැම කොටසක් අවසානයේ පැහැදිලි කර ඇත. නමුත් ඒ පිළිබඳව පූර්ණ අවබෝධයක් ලබා ගැනීමට PHP වැනි ක්‍රමවේද පිළිබඳව දැනුමක් තිබිය යුතුය. නමුත් මෙම ග්‍රන්ථයෙන් PHP පිළිබඳව අධ්‍යනය කිරීමට බාලාපොරොත්තු නොවන බැවින් HTML විෂය ඒකකය තුලදී අවශ්‍ය වන ප්‍රමාණයට මෙහිදී පැහැදිලි කිරීමක් ලබා දී ඇත.
කෙසේ වෙතත් උසස් පෙළ විශය නිර්දේශය තුල name සහ value හි ක්‍රියාකාරීත්වය පිළිබඳව අවබෝධයක් ලබාගැනීමට PHP ඒකකය තුලදී බලාපොරොත්තු වන බැවින් මෙම ඒකකය තුල ඒ පිළිබඳව ගැඹුරින් පැහැදිළි කිරීමට බලාපොරොත්තු නොවේ.


# වදන් ඇතුළත් කිරීම

එක් පේළියක වදන් ඇතුළත් කිරීම සඳහා මෙම ක්‍රමය භාවිතා කළ හැක. මෙහිදී input උපුලනය යටතේ type උපලක්ෂණයේ අගය text ලෙස ලබා දිය යුතුය. මෙමගින් textbox එකක් ප්‍රතිදානය වේ.

**උදාහරණ** chapter_15 /input_text.html

```
<html>
     <head>
          <title> input text-Example </title>
     </head>
     <body>
          <form>
               Usename :
               <input type="text" name="uname">
          </form>
     </body>
</html>
```

**ප්‍රතිඵලය** chapter_15 /input_text.html




මෙහි Username: යන්න උපුලනයට අදාළ නොවේ. එය සාමාන්‍ය ලෙස වෙබ් පිටුවේ යෙදූ වචනයක් පමණි. එය යොදා ඇත්තේ දත්ත ඇතුළත් කරන්නාට තමන් ඇතුළත් කළ යුත්තේ කුමන දත්තයක්ද යන්න දැන ගැනීම සඳහා පමණි.

ඉහත උදාහරණය භාවිතයෙන් name සහ value උපලක්ෂණ පිළිබඳව අධ්‍යනය කරමු.
මෙහිදී name උපලක්ෂණ යටතේ අගය uname ලෙස ලබා දී ඇති අතර value උපලක්ෂණ යටතේ අගයක් ලබා දී නැත. සැබැවින්ම මෙහිදී සිදුවන්නේ අප ඇතුලත් කළ නම value උපලක්ෂණයට ආදේශ වීමයි එනම් ඉහත උදාහරණයේ value හි අගය වන්නේ Ayesh යන්නයි.
දැන් අපි මෙම අගයන් වෙනත් ස්ථානයකට ගෙන යාමේදී හැසිරෙන ආකාරය සලකා බලමු.
මෙහිදී සිදුවන්නේ name හි අගයට value හි අගය සමාන වීමකි. එනම් name = value වීමකි. එය ඉහත උදාහරණය ඔස්සේ සලකා බැලූවිට uname = Ayesh ලෙස ආදේශ වේ. එනම් දත්තය වෙනත් ස්ථානයකට රැගෙන සැකසීමේදී uname යන්න යොදාගනිමින් ඒ සමඟ පැමිණි දත්තය හැසිරවිය හැක. පැහැදිලිවම මතක තබා ගත යුතු කරුණ වන්නේ පරිශීලක ඇතුලත් කරන දත්තය කුමක් වුවත් එය uname ට එනම් name ලෙස ලබා දුන් අගයට ආදේශ වන බවයි. එම නිසා name ලෙස ලබා දුන් අගය යොදා ගෙන එම දත්තය හැසිරවිය හැක. සැබැවින්ම මෙහි name උපලක්ෂණ යටතේ ලබාදුන් අගය හැසිරෙන්නේ විචල්‍යක් ලෙසය. විචල්‍යක් යනු යම්කිසි අගයක් තාවකාලිකව ගබඩාකළ හැකි දෙයකි. එම විචල්‍යට ආදේශවී ඇති අගය හැසිරවීම සඳහා ඕනෑම අවස්ථාවකදී එම විචල්‍යයේ නම භාවිතා කළ හැක.මේ සම්භන්ද සරල උදාහරණයක් ඉදිරියේ පැහැදිලි කර ඇත.
මෙහි එන වැදගත් උපලක්ෂණයක් ලෙස maxlength හැඳින්විය හැක. එමගින් ලබා දිය හැකි උපරිම අක්ෂර ප්‍රමාණය තීරණය කරනු ලබයි.එනම් මෙහි maxlength = 5 ලෙස ලබා දුන් විට අක්ෂර 5 ට වඩා ඇතුළත් කළ නොහැක.

## මුරපද ඇතුළත් කිරීම

මුරපද ඇතුළත් කිරීම සඳහා මෙම ක්‍රමය භාවිතා කළ හැක. මෙහිදී input උපුලනය යටතේ type උපලක්ෂණයේ අගය password ලෙස ලබා දිය යුතුය. එවිට මෙහිදී සාමාන්‍ය පරිදි අක්ෂර දර්ශණය නොවී තිත් පෙලක් දර්ශණය වේ.

උදාහරණ chapter_15 /input_password.html

```
<html>
     <head>
          <title> input password-Example </title>
     </head>
     <body>
          <form>
               password :
               <input type="password" name="pw">
          </form>
     </body>
</html>
```

**ප්‍රතිඵලය** chapter_15 /input_password.html



මෙහිදීද maxlength උපලක්ෂණය යොදාගැත හැක. එමෙන්ම මෙහිදීද name සහ value ඉහත පැහැදිලි කළ පරිදිම ක්‍රියාත්මක වේ.


## පේළි කිහිපයක වාක්‍ය ඇතුළත් කිරීම

input type=text මගින් ඇතුළත් කළ හැක්කේ එක් පේළියක වදන් පමණි. පේළි කීපයක් ඇතුළත් කිරීම සඳහා textarea උසුලනය යොදා ගනී.

**උදාහරණ** chapter_15 /textarea.html

```
<html>
    <head>
        <title> text area-Example </title>
    </head>
    <body>
        <form>
            Description : <br>
            <textarea cols=10 rows=5 name=descrip></textarea>
        </form>
    </body>
</html>
```

**ප්‍රතිඵලය** chapter_15 /textarea.html




මෙහිදීද maxlength උපලක්ෂණය යොදාගැත හැක. මෙහි rows මගින් උස ද cols මගින් දිගද වෙනස් කළ හැක. එමෙන්ම මෙහිදීද name සහ value ඉහත පැහැදිලි කළ පරිදිම ක්‍රියාත්මක වේ. තවත් වැදගත් කරුණක් වන්නේ <textarea> සහ </textarea> අතර යොදන අක්ෂර ඒ තුළ සඳහන් වීමයි එනම් ඉහත උදාහරණයේ .

```
<textarea cols=10 rows=5 name="descript"> Enter your Description
</textarea>
```

ලෙස සඳහන් කලේ නම් ප්‍රතිඵලය පහත පරිදි ලැබේ.




# තෝරාගැනීම් කිහිපයක් එකවර සිදුකිරීම

මෙම ක්‍රමය යටතේදී තෝරා ගැනීම් කීපයක් ලබා දෙන අතර ඉන් එකක් හෝ කිහිපයක් තෝරා ගැනීම කළ හැක. මෙහිදී input උසුලනය යටතේ type උපලක්ෂණයේ අගය checkbox ලෙස ලබා දිය යුතුය.

**උදාහරණ** chapter_15 /input_checkbox.html

```
<html>
    <head>
        <title> input checkbox-Example </title>
    </head>
    <body>
        <form>
            Please select your favorite subject(s) <br>
            <input type="checkbox" name="maths" value="yes">
            Maths <br>
            <input type="checkbox" name="ict" value="yes">
            ICT <br>
            <input type="checkbox" name="pyhsics" value="yes">
            Physics
        </form>
    </body>
</html>
```

**ප්‍රතිඵලය** chapter_15 /input_checkbox.html



මෙම ක්‍රමය යටතේදී name සහ value හි හැසිරීම තරමක් දුරට සංකීර්ණ වන අතර ඒපිළිබඳව සරල හැඳින්වීමක් පහත දැක්වේ.
මෙහි name සඳහා අපට කැමති අගයක් ලබා දිය හැකි අතර value සඳහා ලබා දිය යුත්තේ එම Checkbox Control එක සක්‍රිය කළවිට name ට ලබා දුන් විචල්‍යට ආදේශ විය යුතු වටිනාකමයි. Checkbox සක්‍රියකළ විට ඒවායේ නමට(name) ලබාදී ඇති අගය(value) ආදේශවේ. එනම් මෙහි maths=yes ලෙසත් ict=yes ලෙසත් අගයන් ආදේශ කරගනී. ඒ නිසා සැකසීම හෝ වෙනත් ස්ථානයකට රැගෙනයාම වැනි අවස්ථාවලදී maths සහ ict අගයන් yes ලෙස හඳුනාගනී. Checkbox අක්‍රිය කළ විට ඒවායේ නමට ලබාදී ඇති අගය ආදේශ නොවී එය නොසලකා හරියි.


## තෝරාගැනීම් කිහිපයකින් එකක් තෝරාගැනීම

මෙම ක්‍රමය යටතේදී තෝරා ගැනීම් කීපයක් ලබා දෙන අතර ඉන් එකක් පමනක් තොරා ගැනීම කළ හැක. මෙහිදී input උසුලනය යටතේ type උපලක්ෂණයේ අගය radio ලෙස ලබා දිය යුතුය.

**උදාහරණ** chapter_15 /input_radio.html

```
<html>
    <head>
        <title> input radio-Example </title>
    </head>
    <body>
        <form>
            <input type=“radio” name=“gender” value=“male”>
            Male <br>
            <input type=“radio” name=“gender” value=“female”>
            Female <br>
        </form>
    </body>
</html>
```

**ප්‍රතිඵලය** chapter_15 /input_radio.html




මෙම ක්‍රමය යටතේදී name සහ value හි හැසිරීම තරමක් පෙර පරිදි වන අතර name ට අගයක් යෙදීමේදී සැලකිළිමත් විය යුතුය.

මෙහි name සඳහා අපට කැමති අගයක් ලබා දිය හැකි වුවද සියළු අවස්ථාවන්හී දී ඇතුළත් කළ යුත්තේ එකම අගයකි. value සඳහා ලබා දිය යුත්තේ එම Radio Control එක සක්‍රිය කළවිට name ට ලබා දුන් විචල්‍යට ආදේශ විය යුතු වටිනාකමයි. ඉහත උදාහරණය සැලකූවිට අවස්ථා දෙකෙහිම name සඳහා ලබා දී ඇත්තේ gender යන්නයි. එමෙන්ම එක් අවස්ථාවක value සඳහා male යන්නද අනෙක් අවස්ථාවක value සඳහා female යන්නද ලබා දී ඇත. මෙහිදී අයෙක් male අවස්ථාව තෝරා ගතහොත් gender=male ලෙස gender සඳහා අගය ආදේශ වේ. අයෙක් female අවස්ථාව තෝරා ගතහොත් gender=female ලෙස gender සඳහා අගය ආදේශවේ. ඒ අනුව name සඳහා එකම විචල්‍යයක් ලබා දී ඇති හේතුව ඔබට වැටහෙනු ඇත. සැබැවින්ම ලැබී ඇති තෝරා ගැනීම් අවස්ථා කිහිපය අතරින් එකක් පමනක් තෝරා ගත හැක්කේ එම තෝරා ගැනීම් අවස්ථා සියල්ලේම name සඳහා ලබා දී ඇත්තේ එකම විචල්‍යයක් නම් පමණි. සරලවම ගත්විට name සඳහා එකම විචල්‍යයක් ලබාදී ඇති සියළු Radio Control තනි පද්ධතියක් ලෙස ක්‍රියා කරයි. එම Radio Control අතරින් තෝරා ගත හැක්කේ එකක් පමණි. එනම් ඔබට තවත් තොරාගැනීමක් කිරීමට වෙනත් Radio Control පද්ධතියක් අවශ්‍ය වන්නේ නම් එහි name සඳහා වෙනම විචල්‍යයක් ආදේශ කළ යුතුය.

මෙම කරුණු තරමක් සංකීර්ණ වන අතර ඒ පිළිබඳව සඳහන් කළ ඇත්තේ ඔබගේ දැනුම සම්පූර්ණවීම සඳහා පමනි. පෙර සඳහන් කළ පරිදි උසස් පෙළ විශය නිර්දේශය තුල name සහ value හි ක්‍රියාකාරීත්වය පිළිබඳව ප්‍රායෝගික අවබෝධයක් ලබාදීමට PHP ඒකකය තුලදී බලාපොරොත්තු වන බැවින් මෙම ඒකකය තුල ඒ පිළිබඳව ගැඹුරින් පැහැදිළිකිරීම බලාපොරොත්තු නොවේ.

## දත්ත ඇදහැලීමේ ලැයිස්තු

මෙමගින් දත්ත පහළට ඇදහැලෙන ලැයිස්තුවක් ලෙස ඉදිරිපත් කර එක් දත්තයක් තෝරා ගැනීමට අවස්ථාව ලබාදේ.


මේ සඳහා select යටතේ name සඳහා අගයක්ද ඉන් පසුව option යටතේ value සඳහා අගයක්ද ලබාදිය හැක.

| | |
|---|---|
| select | ලැයිස්තුව නිර්මාණය |
| option | ලැයිස්තුව යටතේ එක් එක් තෝරාගැනීම් යෙදීම |

**උදාහරණ** chapter_15 /dropdown_list.html

```
<html>
    <head>
        <title> Dropdown List-Example </title>
    </head>
    <body>
        <form>
        Please select your favorite subject <br>
            <select name="subject">
                <option value="Maths"> Maths </option>
                <option value="ict"> ICT </option>
                <option value="Physics"> Physics </option>
            </select>
        </form>
    </body>
</html>
```

**ප්‍රතිඵලය** chapter_15 /dropdown_list.html




<option> සහ </option> අතර යොදන අක්ෂර ලයිස්තුවේ දර්ශණය වේ මෙහි name සහ value හි ක්‍රියාකාරීත්වය සරලය. මෙහි name ලබා දී ඇත්තේ select හි උපලක්ෂණයක් ලෙස වන අතර value ලබා දී ඇත්තේ option හි උපලක්ෂණයක් ලෙසය. මෙහිදී පරිශීලකයා තෝරාගන්නා කොටසට අදාල option හි value ලෙස ලබාදී ඇති අගය name ට ආදේශ වේ. එනම් ඉහත උදාහරණයේ දී ICT තෝරා ගැනීම සිදුකළවිට subject=ict ලෙස ආදේශ වේ.

# බොත්තම් ඇතුළත් කිරීම

මෙම ක්‍රමය යටතේදී හඳුනා ගන්නා බොත්තම් වර්ග 3 ක් පවතී. පෙර උදාහරණ පරිදිම input උසුලනයේ type උපලක්ෂණ යටතේ මෙම අගයන් ලබාදිය යුතුය.


| | |
|---|---|
| submit | දත්ත වෙනත් ස්ථානයකට යැවීමට භාවිතා වේ. |
| reset | ෆෝරමේ ඇතුළත් කළ දත්ත මකා දැමීමට භාවිතා වේ |
| button | මෙමගින් සාමාන්‍ය බොත්තමක් ලබා දෙයි |
| image | මෙයද සාමාන්‍ය බොත්තමක් ලෙස ක්‍රියාකරන නමුත් මෙහිදී බොත්තම ලෙස දර්ශණය වන්නේ අප ලබාදෙන පින්තූරයයි |

පළමුවෙන්ම අවදානය යොමුකළ යුතු කරුණ වන්නේ උසස් පෙළ විශය නිර්දේශය තුල submit සහ reset බොත්තම් පිළිබඳව පමනක් පැහැදිලි කිරීමට බලාපොරොත්තු වන බවයි මෙහි submit සහ reset විශේෂ කාර්‍යයන් සඳහා නිර්මාණය කරන ලද ඒවා වේ. ඒපිළිබඳ ඉහත වගුවේ විස්තර කර ඇත. නමුත් button මගින් සාමාන්‍ය බොත්තමක් ලබාදෙන අතර ඒ සඳහා විශේෂ කාර්‍යයක් නොපවතී. එම බොත්තම එබීමෙන් සිදුවියයුතු කාර්‍යය අප විසින් ලබා දිය යුතුය. එමෙන්ම පින්තූර බොත්තමේ ක්‍රියාකාරීත්වය එසේම වුවද එහි එක් විශේෂත්වයක් පවතී එනම් පින්තූර බොත්තම සඳහා සිදුවියයුතු කාර්‍යය අප විසින් ලබා නොදුන් විට එය submit බොත්තමක් ලෙස ක්‍රියාකිරීමයි. කෙසේ වෙතත් බොත්තමක් සඳහා කාර්‍යයන් ලබාදීම පිළිබඳව මෙම ග්‍රන්ථය තුලින් හැදෑරීමට බලාපොරොත්තු නොවන අතර ඉදිරි ග්‍රන්ථයක් තුලින් ඒපිළිබඳ ගැඹුරින් පැහැදිලි කිරීමට බලාපොරොත්තු වේ.

උදාහරණ chapter_15/submit_buttons.html

```
<html>
    <head>
        <title> Submit Buttons-Example </title>
    </head>
    <body>
        <form>
            <input type="submit" name="b1" value="send">
        </form>
    </body>
</html>
```

**ප්‍රතිඵලය** chapter_15/submit_buttons.html





මෙහි value යටතේ ලබාදුන් අගය බොත්තමේ සටහන් වේ. value යටතේ කිසිදු අගයක් ලබා නොදුන්න හොත් බොත්තමේ submit ලෙස සඳහන්වේ. මෙම submit බොත්තමේ ක්‍රියාකාරීත්වය හදුනාගත හැකි උදාහරණයක් දත්ත වෙනත් ස්ථානයකට රැගෙන යාම යටතේ පැහැදිලි කර ඇත.

**උදාහරණ** chapter_15/reset_button.html

```
<html>
    <head>
        <title> Reset Buttons-Example </title>
    </head>
    <body>
        <form>
            Enter Your First Name   :
            <input type="text">  <br> <br>
            Enter Your Last Name   :
            <input type="text">  <br> <br>
            <input type="reset" name="b2" value="clear">
        </form>
    </body>
</html>
```

**ප්‍රතිඵලය** chapter_15/reset_button.html





මෙහි text box තුලට කැමති දෙයක් ඇතුලත් කර ඉන්පසු reset බොත්තම එබීමෙන් text box තුල ඇතුලත් කළ සියළු දේ මැකීයයි. text box පමනක් නොව ඕනෑම වර්ගයේ දත්ත ඇතුලත් කිරීමේ ක්‍රමවේදයකින් ඇතුලත් කළ දත්ත මෙමඟින් මකා දැමිය හැක. එම නිසා reset බොත්තමක් මඟින් එම බොත්තම පිහිටා ඇති ෆෝරමය තුල ඇති සියළු දත්ත මකා දැමිය හැක.

මීළඟට පැහැදිළි කරන බොත්තම් ක්‍රමවේදයේ පෙර සඳහන් කළ පරිදි අපට අවශ්‍යපරිදි ක්‍රියාකරවීමට නිර්මාණය කළ හැක විශය නිර්දේශය තුල මේ පිළිබඳව අධ්‍යනය කිරීම සිදු නොකරන බැවින් මෙම ග්‍රන්ථයෙන් මේ පිළිබඳ පැහැදිලි කිරීමට බලාපොරොත්තු නොවේ. නමුත් ඉදිරියේදී එළිදැක්වීමට බලාපොරෙත්තු වන ග්‍රන්ථයක් තුලින් මෙවැනි ගැඹුරු කරුණු රාශියක් පැහැදිලි කිරීමට නියමිතය.

**උදාහරණ** chapter_15/normal_button.html

```
<html>
    <head>
        <title> Normal Buttons-Example </title>
    </head>
    <body>
        <form>
            <input type="button" name="b3" value="Click Me">
        </form>
    </body>
</html>
```

**ප්‍රතිඵලය** chapter_15/normal_button.html





මීළඟට උදාහරණයෙන් පැහැදිලි කරන බොත්තම් ක්‍රමවේදයේදී බොත්තමක් ලෙස යොදාගනු ලබන්නේ පින්තූරයකි. මේ සඳහා මීට පෙර පරිච්ඡේදයකදී පැහැදිලි කළ පරිදිම ගොනු මාර්ගය සහ ගොනු දිගුව යෙදිය යුතුය.

**උදාහරණ** chapter_15/image_button.html

```
<html>
    <head>
        <title> image Buttons-Example </title>
    </head>
    <body>
        <form>
            <input type="image" name="b4"
            src="data/picbutton.jpg">
        </form>
    </body>
</html>
```

**ප්‍රතිඵලය** chapter_15/image_button.html




## දත්ත කාණ්ඩ කිරීම

ෆෝරමයක පවතින දත්ත කාණ්ඩ කිරීම සඳහා fieldset උසුලනය යොදා ගත හැක එම දත්ත කාණ්ඩයේ නම legend උසුලනය යටතේ ලබා දිය යුතුය

**උදාහරණ** chapter_15/grouping.html

```
<html>
    <head>
        <title> required-Example </title>
    </head>
    <body>
        <form>
            <feildset>
            <legend> Contact deatails </legend>
            Name  : <br>
            <input type="“text”">  <br> <br>
            Address  :
            <textarea>  <textarea>  <br> <br>
            Telephone  : <br>
            <input type="“text”">
            <feildset>
        </form>
    </body>
</html>
```

**ප්‍රතිඵලය** chapter_15/grouping.html




දත්ත කාණ්ඩ කිරීම මඟින් එම දත්ත කාණ්ඩයම එකවර හැසිරවීමට අවස්ථාව සැලසේ

## අමතර ඇතුළත් කිරීම්

මෙම කොටසින් ඔබ වෙත ගෙන එන්නේ විශය නිර්දේශයට අමතරව ඇති නමුත් ප්‍රායෝගික වෙබ් අඩවි නිර්මාණයේදී වැදගත් වන කොටස් කිහිපයකි. විශය නිර්දේශයේ මේ පිළිබඳව පැහැදිලි කිරීමට බලාපොරොත්තු නොවන නිසා මේවා වෙන වෙනම උදාහරණ භාවිතා කර පැහැදිලි කිරීමට බලාපොරොත්තු නොවේ.

<input type=“email”>

මෙමගින් ලැබෙන ප්‍රතිදානයද සාමාන්‍ය text box එකක ස්වරූපය ගනී. නමුත් මෙහි ක්‍රියාකාරීත්වය text box එකකට වඩා විශේෂ වේ. එනම් මෙහිදී අනිවාර්යෙන්ම email ලිපිනයක් ඇතුළත්කළ යුතුය. සැබැවින්ම මෙහිදී සිදුවන්නේ අප ඇතුලත් කරන දත්තයේ email ලිපිනයක ලක්ෂණ පවතී දැයි පරීක්ෂා කිරීමයි. යම් ආකාරයකින් email ලිපිනයක ලක්ෂණ නොමැති දත්තයක් යොදා submit බොත්තම click කළහොත් email ලිපිනයක් ඇතුලත් කරන මෙන් පණිවිඩයක් දිස්වේ.




<input type=“date”>

මෙම ක්‍රමවේදය මඟින් දිනයන් ඇතුලත් කිරීම සඳහා භාවිතා කළ හැක.




<input type=“number”>

මෙම ක්‍රමවේදය මඟින් සංඛ්‍යාත්මක දත්ත පමනක් ඇතුලත් කිරීම සඳහා අවස්ථාව සලසා දේ.



### <input type="url">

මෙමගින් ලැබෙන ප්‍රතිදානයද සාමාන්‍ය text box එකක ස්වරූපය ගනී නමුත් මෙහි ක්‍රියාකාරීත්වය text box එකකට වඩා විශේෂ වේ. එනම් මෙහිදී අනිවාර්යෙන්ම url ලිපිනයක් ඇතුළත්කළ යුතුය. මෙහිදී සිදුවන්නේ අප ඇතුලත් කරන දත්තයේ url ලිපිනයක ලක්ෂණ පවතී දැයි පරීක්ෂා කිරීමයි. යම් ආකාරයකින් url ලිපිනයක ලක්ෂණ නොමැති දත්තයක් යොදා submit බොත්තම click කළහොත් url ලිපිනයක් ඇතුලත් කරන මෙන් පණිවිඩයක් දිස්වේ.





### <select name="subject" multiple>

මෙමගින්ද ලබා දෙන්නේ දත්ත ලයිස්තුවකි නමුත් මෙය දත්ත ඇදහැලීමේ ලයිස්තුවට වඩා ස්වරූපයෙන් වෙනස් වේ මෙය නිර්මාණය කිරීම සෑම අතකින්ම ගත් විට දත්ත ඇදහැලීමේ ලයිස්තුවකට සමාන වේ මෙහි එකම වෙනස්කම වන්නේ උසුලනය යටතේ උපලක්ෂණය ලබා දිය යුතු වීමයි ඉන් පසු දත්ත ඇදහැලීමේ ලයිස්තුවටක් නිර්මාණය කළ ආකාරයටම උසුලනය මඟින් දත්ත ලබා දිය යුතුය




### <input type="range">



## අත්‍යවශ්‍ය දත්ත ඇතුලත් කිරීම


වෙබ් අඩවිය භාවිතා කරන පුද්ගලයින් form එකක් තුළට තම දත්ත ඇතුළත් කිරීමකදී වැරදීම් සහ අතපසුවීම් සිදුවීමේ ප්‍රවණතාවක් පවතී. යම් හෙයකින් අප එවනි දත්තයක් ගෙන සැකසීමට භාවිතා කිරීමෙන් එයින් ලැබෙන ප්‍රතිඵල දෝශ සහගත විය හැක. එමෙන්ම අපද වෙබ් අඩවි පරිශීලකයාද ඉන් මහත් අපහසුතාවයකට පත් වේ. මෙවැනි අවස්ථාවන්ට පිළියම්ද HTML තුළ පවතී.

මේ සඳහා input උසුලනය යටතේ required උපලක්ෂණය යෙදිය යුතුය.

මෙහි ක්‍රියාකාරීත්වය සිදුවනුයේ submit බොත්තම එබීමේදීය. එනම් මෙහි යම් input උසුලනයක් යටතේ required ලබා දී තිබුනේ නම් submit බොත්තම එබීමට පෙර එම input උසුලනයට අදාල කොටසේ දත්තය ලබාදී තිබිය යුතුය. යම් හෙයකින් required උපලක්ෂණය යොදාතිබූ කොටසකට අදාල දත්ත ලබා නොදී submit බොත්තම එබීම කළහොත් එම දත්ත කොටස හිස්ව තැබිය නොහැකි බව දක්වමින් පණිවිඩයක් දිස්වේ.

මීළඟ උදාහරණයේ ප්‍රායෝගික අවස්ථාවක් පෙන්වා ඇත. යම් අවස්ථාවකදී පරිශීලකගෙන් යම් ගිණුමකට ඇතුල්වීමට username සහ password ඉල්ලා සිටින අවස්ථාවක් සලකමු. මෙහිදී මෙම දත්ත දෙකම ඇතුළත් කිරීම අත්‍යාවශ්‍ය වේ. මක්නිසාද යත් මෙම දත්ත දෙකෙන් එකක් හෝ නොමැතිව ගිණුමට ඇතුල්විය නොහැකි නිසාවෙනි. මෙවැනි අවස්ථාවලදී මෙම ක්‍රමය යොදා ගැනීම ප්‍රායෝගික වේ.

```
Usename : <input type="text" required> <br>
Password : <input type="password" required> <br>
<input type="submit">
```




මෙම උදාහරණයේ input අවස්ථා දෙකටම required ලෙස ලබා දී ඇත. මෙහිදී password කොටසට අගයක් ලබා නොදී submit බොත්තම click කළ විට එම හිස්තැන් සහිත කොටස සම්පූර්ණ කරන මෙන් පණිවිඩයක් දිස් වීම සිදුවේ.

## දත්ත වෙනත් ස්ථානයකට ගෙනයාම

අපි මෙතෙක් අධ්‍යනය කළ වෙබ් ෆෝරමයක ප්‍රධාන වැදගත්කම වන්නේ වෙබ් පිටු පරිශීලකගෙන් දත්ත එක්රැස් කර ඒවා සැකසීමට භාජනය කිරීම හෝ වෙනත් ස්ථානයක ගබඩා කිරීමට අවශ්‍යවන මූලික පහසුකම් සැපයීමයි.
මෙහිදී දත්ත එක්රැස් කර වෙනත් ස්ථානයකට රැගෙන යාම සිදුකළ යුතුය. මේ සියළු කටයුතු සඳහා වර්තමානය වන විට බහුලව භාවිතා කරන්නේ PHP හි ක්‍රමවේද වේ. කෙසේ නමුත් PHP සඳහා විෂය නිර්දේශයේ වෙනම ඒකකයක් වෙන් කර ඇති බැවින් මෙම ග්‍රන්ථයෙන් ඒ පිළිබඳව පැහැදිලි කිරීම බලාපොරොත්තු නොවේ.
PHP ඒකකය වෙනුවෙන්ද ඉදිරියේ මෙවැනිම ග්‍රන්ථයක් සම්පාදනය කිරීමට බලාපොරොත්තු වන අතර එම ග්‍රන්ථය තුලින් PHP විශය කරුණු මුලසිට ඉදිරිපත් කිරීමට බලාපොරොත්තු වෙමි. කෙසේ වෙතත් ඒ සඳහා අවශ්‍ය මූලික කරුණු මෙම ග්‍රන්ථයෙන් පැහැදිලි කර ඇත. ඒමෙන්ම එම කරුණු නැවත දීර්ඝ ලෙස ඉදිරි PHP ග්‍රන්ථය තුළින් පැහැදිලි කිරීමට බලාපොරොත්තු වේ.


නමුත් පෙර සඳහන් කළ පරිදි ඉහතදී උගත් කරුණු සම්බන්දයෙන් සරල උදාහරණයක් පිළිබඳව මීලඟට පැහැදිලි කර ඇත.

ඉහත උදාහරණ වලදී name සහ value උපලක්ෂණ පිළිබඳව තරමක කෙටි පැහැදිලි කිරීමක් ලබා දෙන ලදි. එහිදී දත්ත වෙනත් ස්ථානයකට ගෙන යාමේදී name = value ලෙස ගමන් කරන බව පැහැදිලි කරන ලදි. එය පහත උදාහරණය මගින් තව දුරටත් පැහැදිලි කර ඇත.

**උදාහරණ** chapter_15 /sending_data.html


```
<html>
    <head>
        <title> sending data-Example </title>
    </head>
    <body>
        <form>
            Usename :
            <input type="“text”" name="“uname”"> <br>
            password :
            <input type="“password”" name="“pw”"> <br>
            <input type="“submit”" name="“b1”" value="“send”">
        </form>
    </body>
</html>
```

**ප්‍රතිඵලය** chapter_15 /sending_data.html





ඉහත උදාහරණයෙන් මෙම ප්‍රතිඵලය ලැබෙන අතර මෙහිදී අපට කැමති පරිදි දත්ත ඇතුලත් කළ හැක.


මෙහි දී මීළඟ පියවර වශයෙන් Username සඳහා Ayesh ලෙසත් Password සඳහා 1234 ලෙසත් ලබාදී ඇත.





ඉන් පසු submit බොත්තම එබීම සිදුකළ යුතුය. එවිට කිසිදු වෙනස් කමක් සිදුනොවුනේ යැයි පෙනුනද මීලඟට ඔබ අවදානය යොමුකල යුතුතේ වෙබ් පිටුවේ URL කොටස වෙතයි.




සැබැවින්ම ඔබ මෙහි අවදානය යොමු කළ යුත්තේ URL ලිපිනයේ අවසාන කොටසටයි.




මෙහි ? ලකුණින් පසුව ඇති කොටස වෙත අවදානය යොමු කරන්න. එහි uname=Ayesh ලෙසත් pw=1234 ලෙසත් සඳහන් වී ඇත. ඒ අනුව name සඳහා අප ඇතුලත් කළ අගයට value සඳහා අප ඇතුලත් කළ අගය සමාන වී ඇත. ඒ අනුව අප මීට පෙර අධ්‍යනය කළ කරුණු මෙම උදාහරණය මඟින් ප්‍රායෝගිකව පැහැදිලිවී ඇත.එමෙන්ම URL තේරීමට ලක් නොකර ඒ මතට ඊහිස ගෙන යාම මඟින් මෙම කොටස දර්ශණය වේ.




ෆෝරම පිළිබඳව පුළුල්ව අධ්‍යනය කළ යුතු action , method වැනි කරුණු HTML දැනුම පමනක් භාවිතයෙන් අවබෝධකර ගත නොහැක. එමනිසා එවැනි කරුණු පෙර සඳහන් කළ පරිදි ඉදිරියේදී නිකුත් වන PHP ග්‍රන්ථයකින් පැහැදිලි කිරීමට බලාපොරොත්තු වෙමි.

# 16

# වෙබ් පිටුව කොටස් කිරීම හා ඒවාට සම්බන්ධතා ඇති කිරීම

- පිටුව කොටස් කිරීම
- කොටස් සඳහා සම්බන්ධතාව ලබාදීම

# පිටුව කොටස් කිරීම


මෙය වර්ථමානයේ බොහෝ වෙබ් අඩවි බහුලව භාවිතා කරන ඉතාමත්ම ප්‍රායෝගික ක්‍රමවේදයකි. මෙම ක්‍රමය භාවිතයෙන් ඉතා විශාල සහ දිග වෙබ් පිටුවල එක් එක් කොටස් මතට සම්බන්ධතා ඇති කළ හැක. උදාහරණයක් ලෙස ගත් විට ඉතා දිග වෙබ් පිටුවක පහලම කොටසට ගමන් කිරීමට වෙබ් පිටුව ආරම්භයේදීම සම්බන්දතාවක් නිර්මාණය කළ හැක. එමඟින් වෙබ් අඩවිය පරිශීලනය කරන පුද්ගලයාට වෙබ් පිටුව පුරා ගමන් කිරීමෙන් සිදුවන අපහසුතාවය ඇති නොවේ.

මේ සඳහා මීට පෙර අප යොදාගත් <a> උසුලනයම යොදා ගනී. මෙහිදී අපට අවශ්‍ය ආකාරයෙන් වෙබ් පිටුව කොටස් කළ හැකි අතර එම කොටසේ නම name උපල්ෂණය යටතේ ලබා දිය යුතුය.

උදාහරණ chapter_16/Page_Section.html

```
<html>
    <head>
        <title> Page Section-Example </title>
    </head>
    <body>
        <a name="part1">
            <font color="red">
            <h1> First part of the document </h1>
            </font>
        </a>
        <a name="part2">
            <font color="blue">
            <h1> Second part of the document </h1>
            </font>
        </a>
    </body>
</html>
```

ප්‍රතිඵලය chapter_16/Page_Section.html




<a name=part1> කොටසින් එම ප්‍රදේශය part1 ලෙස නම් කර ඇති අතර එම ප්‍රදේශය </a> යන කොටසින් අවසන් වේ. ඒ අනුව part1 ප්‍රදේශය තුළ <h1> ප්‍රමාණයේ first part of the document කොටස පවතී.
එමෙන්ම <a name=part2> කොටසින් එම ප්‍රදේශය part2 ලෙස නම් කර ඇති අතර එම ප්‍රදේශය </a> යන කොටසින් අවසන් වේ. ඒ අනුව part2 ප්‍රදේශය තුළ <h1> ප්‍රමාණයේ second part of the document කොටස පවතී.

## කොටස් සඳහා සම්බන්ධතාව ලබාදීම


පළමු පියවර මේ වන විට සාර්ථකව නිමා කර ඇත. එනම් වෙබ් පිටුව කොටස් කිරීම ඉහත උදාහරණයෙන් සිදුකරන ලදි. එහිදී අප වෙබ් පිටුව කොටස් දෙකකට කොටස් කළ අතර ඒවා part1 සහ part2 ලෙස නම් කරන ලදි.
මීළඟ උදාහරණයෙන් අප එම කොටස් සඳහා එම වෙබ් පිටුව තුලම සම්බන්දතා ඇති කරන ආකාරය සලකා බලමු. එයද මීට පෙර භාවිතා කළ <a> උසුලනයම යොදා ගනී. ඒ යටතේ href උපලක්ෂණය මගින් සම්භන්දතාවය ලබා දිය යුතු ස්ථානය තොරා ගත යුතුය.
පහත උදාහරණයේ ආරම්භයේදීම First part සහ Second part ලෙස දිස්වන අතර ඒ සඳහා පිළිවෙලින් part1 සහ part2 යන කොටස් සම්බන්ද කර ඇත.
එමෙන්ම ඉතා වැදගත් කරුණක් වන්නේ මෙහි සම්බන්දතාව ඇති කරන විට නමට පෙර # ලකුණ යෙදීම අනිවාර්ය වීමයි.

උදාහරණ chapter_16/Linking_to_a_Page_Section.html

```
<html>
    <head>
        <title> Linking to a Page Section-Example </title>
    </head>
    <body>
        <a href="#part1"> First part </a>
        <a href="#part2"> second part </a>

        <a name="part1">
            <font color="red">
            <h1> First part of the document </h1>
            </font>
        </a>
        <a name="part2">
            <font color="blue">
            <h1> Second part of the document </h1>
            </font>
        </a>
    </body>
</html>
```

**ප්‍රතිඵලය** chapter_16/Linking_to_a_Page_Section.html




මෙම උදාහරණය නිවරදිව ක්‍රියාත්මක වීම සඳහා ප්‍රමාණයෙන් විශාල වෙබ් අඩවියකට මෙම ක්‍රමය යොදා අත්හදා බැලිය යුතුය.
මෙම උදාහරණය අනුව First part මත click කළ විට part1 ලෙස නම් කළ කොටසට ගමන් කිරීමත් Second part මත click කළ විට part1 ලෙස නම් කළ කොටසට ගමන් කිරීමත් සිදුවේ. එම ගමන් කිරීම නිවරදිව දර්ශණය වීමට වෙබ් පිටුව ප්‍රමාණයෙන් විශාල එකක් විය යුතුය.

# 17

# අතිරේක කියවීම්

- උඩු කොමා යෙදීමේ අවශ්‍යතාව
- වර්ණ භාවිතා කිරීමේ ක්‍රම
- ගොනු මාර්ගය සහ ගොනු දිගුව
- වෙබ් පිටුව save කිරීම සහ සංවර්ධන කිරීමෙදී ඇතිවන ගැටළු නිරාකරණය
- වෙබ් පිටුව විවෘත වීමට වෙබ් අතරික්සුවක් (web browser) තෝරා ගැනීම

## උඩු කොමා යෙදීමේ අවශ්‍යතාව

ග්‍රන්ථයේ පැහැදිලි කර ඇති උදාහරණ වල උපලක්ෂණ සඳහා අගයන් යෙදීමේදී බොහෝ අවස්ථාවල යුගල උඩු කොමා භාවිතා කළ හැක. ඇත්ත වශයෙන්ම මෙම උඩුකොමා යෙදීමේ වැදගත්කම බොහෝ දෙනෙකුගේ අවධානය යොමු නොවන කාරණාවකි. බොහෝ දෙනා මෙය පුරුද්දක් වශයෙන් යෙදීම සිදුකරන කටයුත්තකි.
කෙසේ වෙතත් මෙම කොටස තුලින් උඩු කොමා යෙදීමට හේතුව කෙටියෙන් පැහැදිලි කර ඇත.

උදාහරණයක් ලෙස <font color="red"> යන්න සලකන්න.
මෙය <font color=red> ලෙසද එනම් උඩු කොමා නොයොදා නිර්මාණය කළද ප්‍රතිඵලයේ කිසිදු වෙනසක් සිදු නොවේ.

මීළඟට <font color="sky blue"> යන්න සලකන්න එයද සාමාන්‍ය පරිදි ක්‍රියාත්මක වන අතර එවිට අකුරු ලානිල් පැහැයකින් දක්නට ලැබේ. ඉන් පසු පෙර පරිදිම එනම් උඩු කොමා නොමැතිව නිර්මාණය කරන්න.
<font color=sky blue> එවිට අප බලා පොරොත්තු වන ප්‍රතිඵලය නොලැබී කිසිදු වර්ණයක් නොයෙදුවා මෙන් කළු වර්ණයෙන් දිස්වේ.

සැබැවින්ම මෙම අවස්ථාවේදී color යන උපලක්ෂණය හඳුනාගන්නේ sky යන කොටස පමනකි. ඉන් පසු හිස්තැනක් පවතින නිසා ඉතිරි කොටස හඳුනා ගන්නේ color හි අගයක් ලෙස නොව font හි උපලක්ෂණයක් ලෙසය. එනම් blue යන කොටස font හි උපලක්ෂණයක් ලෙස ක්‍රියාත්මක වීමට උත්සහදරයි. නමුත් font සඳහා blue ලෙස උපලක්ෂණයක් නොපවතින බැවින් එයින් කිසිදු ප්‍රතිදානයක් නොලැබීම සිදුවේ. ඒ නිසා sky blue යන්න එක් අගයක් ලෙස ආදේශ වීමට උඩු කොමා යෙදීම අනිවාර්යෙන් කළ යුතුය.

එමෙන්ම මෙහිදී උඩු කොමා ( ' ' )හෝ ද්විත්ව උඩු කොමා ( " " ) යන කැමති ආකාරයක් භාවිතා කළ හැක.

## වර්ණ භාවිතා කිරීමේ ක්‍රම

HTML තුළ විවිධ අවස්ථා වලදී වර්ණ භාවිතා වේ. මෙම වර්ණ ආකාර දෙකකට භාවිතා කළ හැක.

**වර්ණයේ නම භාවිතා කිරීම**

මෙහිදී වර්ණයන්හී අප දන්නා නම සෘජුවම භාවිතා කළ හැක. එනම් red , green , blue , yellow , pink ලෙස නම යෙදිය හැක.

```
<font color=pink>
```

## වර්ණයේ ෂඩ් දශමය අංකනය භාවිතා කිරීම

ඉහත පරිදි සෑම වර්ණයකම නම මතක තබා ගැනීම අපසු කටයුත්තකි මේ සඳහා පිළියමක් ලෙස පහත ක්‍රමය හදුන්වා දිය හැක

මෙහිදී # ලකුණින් ආරම්භ වන අතර ඉන්පසු යෙදෙන සංඛ්‍යාංක දෙකෙන් දෙකට රතු (R) කොළ (G) නිල් (B) වර්ණ වල සංඛ්‍යාංක දෙක බැගින් නිරූපණය වේ. නමට මුළින් # යෙදීම අනිවාර්ය වේ.මෙහිදී අවදානය යොමුකළ යුතු ප්‍රධාන කරුණ වන්නේ මෙය ෂඩ් දශමය සංඛ්‍යා පාදයෙන් නිරූපනය වන බවයි එනම් එක් සංඛ්‍යාංකයක තිබිය හැකි අවම අගය 0 වන අතර උපරිම අගය f වේ.

ඒ අනුව මෙහි පෙදු නිරූපණය වන්නේ

#RRGGBB වේ.

මෙහි එක් එක් ස්ථාන සඳහා අවශ්‍ය පරිදි සංඛ්‍යා යෙදීමෙන් වර්ණ සංකලනය කළ හැක. ඒ අනුව මෙමඟින් රතු වර්ණය ලබා ගැනීමට අවශ්‍ය නම් රතු වර්ණයට අයත්වන සංඛ්‍යාංක දෙකෙහි එනම් මුල්ම සංඛ්‍යාංක දෙකෙහි අගය උපරිම කළ යුතුය. එමෙන්ම අනෙක් ස්ථාන වල අගය අවම කළ යුතුය. එනම් මුල් සංඛ්‍යාංක දෙකෙහි අගය f ලෙසත් ඉන් පසුව පවතින සියළු සංඛ්‍යාංක 0 ලෙසත් ලබා දිය යුතුය.

එනම් රතු වර්ණයේ ෂඩ් දශමය නිරූපණය වන්නේ #ff0000 වේ. එවැනි වර්ණ කීපයක් පහත වගුවේ පෙන්වා ඇත.

| නම | RR | GG | BB | |
|---|---|---|---|---|
| සුදු | 00 | 00 | 00 | |
| කළු | ff | ff | ff | |
| රතු | ff | 00 | 00 | |
| කොළ | 00 | ff | 00 | |
| නිල් | 00 | 00 | ff | |
| කහ | ff | ff | 00 | |
| අහස් නිල් | 66 | 66 | ff | |

එමෙන්ම 0 සහ f අතර ඇති ඕනෑම සංඛ්‍යාවක් භාවිතයෙන් ඉතා නිර්මාණාත්මකව වර්ණ සංකලනය කළ හැක.

තවද මෙම ශඩ් දශමය වර්ණ සංකලනය සදහා ක්‍රම දෙකක් පවතී.

පළමු ක්‍රමය වන්නේ එක් වර්ණයක් සඳහා බිටු එක් සංඛ්‍යාවක් භාවිතා කිරීමයි එහිදී රතු වර්ණය නිරූපණය වන්නේ #f00 ලෙසය.

දෙවන ක්‍රමය වන්නේ එක් වර්ණයක් සඳහා බිටු එක් සංඛ්‍යාවක් භාවිතා කිරීමයි එහිදී රතු වර්ණය නිරූපණය වන්නේ #fff000000 ලෙසය.

# ගොනු මාර්ගය සහ ගොනු දිගුව


HTML තුළ දී විවිධ ගොනු සමඟ වැඩ කටයුතු සිදුකළ යුතුය. ඒ සඳහා ගොනු මාර්ගය සහ ගොනු දිගුව පිළිබද හොඳ අවබෝධයක් ලබා ගත යුතුය.
ගොනුවක් සැලකූවිට එහි සැකැස්ම පහත පරිදි වේ.

**ව්‍යුහය**

____________________ . __________

↑ ගොනු මාර්ගය හා නාමය ↑ ගොනු දිගුව

HTML තුළ ගොනුවක් ආදේශ කර ගැනීමේ දී ගොනු වර්ගය හදුනා ගැනීමට අත්‍යාවශ්‍ය වේ. ඒ සඳහා ගොනු දිගුව ඉතාමත් නිවරදිව යෙදිය යුතුය.
ගොනු දිගුව ඉහත ව්‍යුහයේ සඳහන් කළ පරිදි ගොනු නාමය අවසානයේ. සළකුණකින් පසුව දැක ගත හැක. එසේ දැකගත නොහැකි නම් ගොනුදිගුව නොදන්නේ නම් අදාළ ගොනුව මත right click කර properties වෙත ගොස් file type මගින් ගොනුදිගුව දැනගත හැක.




ගොනු දිගුව නොයෙදූ හෝ වැරදි ලෙස යෙදූ කිසිදු ආදේශයක් කිසිසේත් සාර්ථක නොවේ.

පහත වගුවෙන් දැක්වෙන්නේ විවධ ගොනු වර්ග කිහිපයක් සහ ඒවායේ පැවතිය හැකි ගොනු දිගු කිහිපයකි.

| | |
|---|---|
| වෙබ් පිටු | .html , .htm |
| ඡායාරූප | .jpg , .png , .tif |
| වීඩියෝ ගොනු | .mp4 , .avi , .mkv , .wmv , .mov , .3gp |
| ශ්‍රව්‍ය ගොනු | .mp3 , .wma , .m4a |

ආදේශ කරන ගොනු HTML ගොනුවත් සමඟම එකම folder තුළ පවතී නම් ගොනු මාර්ගය සඳහන් කළ යුතු නොවේ. ගොනු නාමය යෙදීම ප්‍රමාණවත් වේ.
උදාහරණයක් ලෙස පහත අවස්ථාවේදී අප නිර්මාණය කරමින් පවතින්නේ index නම් වෙබ් පිටුවයැයි සලකන්න. එහිදී අප නිර්මාණය කරමින් පවතින වෙබ් පිටුව සමඟම අපට අවශ්‍ය පින්තූරය පවතී එනම් අපට එය index නම් වෙබ් පිටුව තුලට ලබා ආදේශ කර ගැනීමට ගොනු නාමය පමනක් ප්‍රමාණවත්වේ.




```
<img src = “fruits.png”>
```

නමුත් මෙලෙස ප්‍රායෝගික මට්ටමේ වෙබ් පිටුවක් නිර්මාණය කිරීමේදී වෙබ් පිටුව තුලට ආදේශ කර ගැනීමට බලාපොරොත්තු වන ගොනු වෙන වෙනම ෆෝල්ඩර තුල යොදා භාවිතා කළ යුතුය. එමඟින් වෙබ් අඩවිය නිර්මාණය සඳහා පහසු වන අතර ගොනු නිවරදි ලෙස කළමණාකරණය කර ගත හැක.

පහත අවස්ථාව පිළිබඳ අවදානය යොමු කරන්න. මෙහිදී පින්තූරය pics නම් ෆෝල්ඩරයක් තුල තබා ඇත. එවිට ගොනු නාමය හා ගොනු දිගුව පමනක් ප්‍රමාණවත් නොවන අතර ගොනු මාර්ගයද අත්‍යාවශ්‍ය වේ.




```
<img src = “pics/fruits.png”>
```

මෙම පින්තූරය data නම් ෆෝල්ඩරය තුල ඇති pics ෆෝල්ඩරයේ පිහිටා ඇත්නම්

```
<img src = “data/pics/fruits.png”>
```

ගොනු ආදේශයේදී මෙලෙස ගොනු මාවත හා ගොනු නාමය හා ගොනු දිගුව තේරීමට එම ගෙනුව අප නිර්මාණය කරන වෙබ් පිටුව සමඟ හෝ වෙබ් පිටුව සමඟ පවතින ෆෝල්ඩරයක් තුල පිහිටා තිබිය යුතුය. ඉහත පැහැදිලි කළ උදාහරණ දෙක එවැනි අවස්ථා දෙකකි. නමුත් වෙනම ස්ථානයක පවතින ගොනුවක් ආදේශ කළ යුතු වන්නේ නම් එහිදී සම්පූර්ණ ගොනු මාර්ගයම සහ සාමාන්‍ය පරිදි ගොනු දිගුව යෙදිය යුතුය.

```
<img src = “C:\Users\ACS\Pictures\fruits.png”>
```

නමුත් මෙය ප්‍රායෝගිකව වෙබ් පිටු නිර්මාණයෙදී කිසිවිටකත් නොකල යුතුය. එයට හේතුව වන්නේ වෙබ් අඩවිය උඩුගත (upload) කරන විට එම වෙබ් අඩවියට ආදේශ කළ සියළු ගොනු වෙබ් අඩවිය සමඟම උඩුගත කළ යුතු වීමයි. එමනිසා හොදම ක්‍රමය වන්නේ වෙබ් අඩවියට ගොනු ආදේශ කිරීමට පෙර එම සියළු ගොනු වෙබ් පිටුව සමඟ ඇති ෆෝල්ඩර වල තැන්පත් කිරීමයි.එලෙස තැන්පත් කිරීමෙදී තවත් කරුණක් මතක තබා ගත යුතුය එනම් ප්‍රධාන වෙබ් පිටුව කිසිදු ෆෝල්ඩරයක් තුල නොදැමිය යුතුය අනෙක් සියළු වෙබ් පිටු පින්තූර ශ්‍රව්‍ය ගොනු දෘශ්‍ය ගොනු ආදිය ෆොල්ඩර වල තැන්පත් කළ යුතුය මෙය වෙබ් අඩවිය උඩුගත (upload) කරන විට අත්‍යවශ්‍ය කරුණක් වේ. එමෙන්ම එලෙස සිදු කිරීම මඟින් වෙබ් අඩවිය ක්‍රමානුකූලව සහ පැහැදිලිව නිර්මාණය කළ හැක. පහත දක්වා ඇත්තේ එවැනි ගොනු සැකසුමකි.



# වෙබ් පිටුව save කිරීම සහ සංවර්ධන කිරීමේදී ඇතිවන ගැටළු නිරාකරණය

HTML වෙබ් පිටුව ප්‍රථම වතාවට save කිරීම සිදුකරන ආකාරය ග්‍රන්ථයේ මුල් කොටසකදී පැහැදිලි කර ඇත.
නිර්මාණය කළ වෙබ් පිටුවේ ප්‍රභව කේතය නැවත නැවත කුඩා වෙනස්කම් කරමින් සංවර්ධනය කිරීම අනිවාර්යෙන් සිදුකිරීමට වන ක්‍රියාවලියකි. එවිට වෙබ් පිටුව නැවත නැවත save කිරීම කළ යුතුය. ඔබ පැහැදිලිවම මතක තබා ගත යුතු කරුණ වන්නේ වෙබ් පිටුවට කුමන ආකාරයේ සුළු වෙනස්කමක් වුවද සිදුකළ විට එහි ප්‍රතිඵලය නිරීක්ෂණය කිරීමට

පළමුව වෙබ් පිටුව save කළ යුතුය.
දෙවනුව වෙබ් අතරික්සුවේ (web browser) මේ වන විට දර්ශනය වන වෙබ් පිටුව වෙනුවට අළුතින් save කළ වෙබ් පිටුව දර්ශනය කර ගත යුතුය.

දැන් අප මෙම පියවර විස්තරාත්මක පැහැදිලි කරගනිමු.

වෙබ් පිටුව පළමු වතාවට save කරන ආකාරය ඔබ මේවනවිට අධ්‍යනය කර ඇතැයි විශ්වාස කරමි වෙබ් පිටුව සුළු වෙනස්කම් සිදුකිරීම නිසා නැවත නැවත save කරනවිටද එම පියවරම අනුගමනය කරමින් save කළ හැක. මෙහිදී සිදුවන්නේ අප ආරම්භයේම නමක් ලබා දී නිර්මාණය කළ වෙබ් පිටුවම අළුත් වීමකි මෙහිදී වෙබ් පිටුව save කිරීමට file >> save වෙත ගමන් කිරීම කළ යුතු බව මින් පෙර පැහැදිලි කර ඇත. එමෙන්ම මේ සඳහා යොදා ගත හැකි කෙටි ක්‍රමයක්ද පවතී. එනම් ctrl යතුර සමඟ S යතුර එකවර ලබා දීමයි. ( ctrl + s )

පළමුවර වෙබ් පිටුව නිර්මාණයකර ඉන් පසුව එම වෙබ් පිටුව වෙබ් අතරික්සු මෘදුකාංගයෙන් විවෘත කළ පසු අප වෙබ් පිටුව ඉහත සඳහන් කළ පරිදි නැවත නැවත save කළද ඊට සරිලන පරිදි වෙබ් පිටුව වෙනස් නොවේ. එසේ වෙනස් වීමට නම් save කරන සෑම වාරයක්ම පාසා වෙබ් අතරික්සු මෘදුකාංගයෙන් එය නැවත නැවත විවෘත කළ යුතුය. මෙය අපහසු කටයුත්තකි මේ සඳහා සෑම වෙබ් අතරික්සු මෘදුකාංගයකම refresh නම් අංගයක් පිහිටා ඇත.



ඉහත රූපසටහනේ එම බොත්තම දක්වා ඇත එය එබීම මඟින් සිදුවන්නේ මේ වන විට වෙබ් අතරික්සුව තුල පෙන්වමින් පවතින වෙබ් පිටුව නැවත අලුතින්ම ප්‍රවේශ කරගැනීමකි (reload). මේ වන විට පෙර පැවති වෙබ් පිටුවට නව වෙනස්කමක් කර ඇති නිසා එම වෙනස්කම සහිත වෙබ් පිටුව ප්‍රතිදානයවේ.

සරලවම ගත් විට වෙබ් පිටුවේ ප්‍රභව කේතයේ කුඩා හෝ වෙනස් කමක් කළ පසු එහි ප්‍රතිදානය බලා ගැනීම සඳහා එය save කර ඉන් පසු වෙබ් පිටුව refresh කළ යුතුය.

අප මේවනවිට නිර්මාණය කරමින් පවතින වෙබ් පිටුව නැවත වෙනත් නමකින් save කළ යුතු නම් එවිට file >> Save As මඟින් save කළ යුතුය. එවිට නැවත නමක් ලබාදිය යුතුවන අතර එහිදීද ග්‍රන්ථයේ මුලින්ම සඳහන් කළ උපදෙස් පිළිපැදිය යුතුය.

ග්‍රන්ථයේ සෑම උදාහරණයකම පාහේ උසුලන ක්‍රමානුකූලව පෙළ ගැසීමට tab යතුර භාවිතා කර ඇත.

```
<head> <title> First web page  </title> </head>
```

```
<head>
<title> First web page  </title>
</head>
```

```
<head>
    <title> First web page  </title>
</head>
```


ඉහතදී එකම උසුලනයන් ආකාර තුනකට පෙළගැන්වීමක් සිදුකර ඇත. සැබැවින්ම මෙම ආකාර තුනෙන්ම ලැබෙන ප්‍රතිදානය එක සමානය නමුත් මෙම ආකාර තුනෙන් වඩා යෝග්‍ය වන්නේ තුන්වන ආකාරයයි. එම ආකාරයේදී ඉතා ක්‍රමානුකූලව උසුලන පෙළගැන්වීම සිදුකර ඇති අතර එමඟින් වෙබ් අඩවි නිර්මාණකරුට විශාල පහසුවක් සැලසේ. එම නිසා කුඩා වෙබ් පිටු නිර්මාණය කරන අවදියේ සිටම ඔබ මෙලෙස ක්‍රමානුකූලව උසුලන පෙළගැන්වීමට හුරුවිය යුතුය.

මෙම තුන්වන අවස්ථාවේදී දෙවන පේළියේ මුලින්ම tab යතුර ලබාදී උසුලනයන් ක්‍රමානුකූලව පෙළගන්වා ඇත.


# වෙබ් පිටුව විවෘත වීමට වෙබ් අතරික්සුවක් (web browser) තෝරා ගැනීම

පෙර 17 වන පිටුවේ සඳහන් කළ පරිදි ඇතැම් අවස්ථාවන්හීදී වෙබ් පිටුව නිවරදිවම සුරුකීම (save) සිදුකළත් එය වෙබ් අතරික්සුවක් (web browser) මඟින් විවෘත වීමට සුදානම් නොවිය හැක. මෙවැනි අවස්ථාවලදී පහත ක්‍රියාමාර්ගය අනුගමනය කිරීම සිදුකරන්න.

වෙබ් පිටුව නිවරදිව සුරකීම මුලින්ම කළ යුතුය ඉන් පසුව වෙබ් පිටුව save වූ ස්ථානයට ගොස් එය මත right click කරන්න.





ඉන් පසුව Open with මත click කරන්න ඒතුලින් ඔබ කැමති වෙබ් අතරික්සුව (web browser) තෝරන්න.





එවිට ඔබ නිවරදිව වෙබ් පිටුව save කර ඇත්නම් සාර්ථකව වෙබ් අතරික්සුව තුල වෙබ් පිටුව ප්‍රතිදානය වනු ඇත.

නමුත් මෙම ක්‍රියාවලිය වෙබ් පිටුව විවෘත කරන සියළු අවස්ථාවන් හිදී සිදුකිරීමට ඔබට සිදුවේ. මෙය තරමක් අපහසු ක්‍රියාවකි ඒ නිසා මීලඟට පහලින්ම ඇති Choose another app යන්න තෝරන්න.




එමගින් ඔබට කැමති වෙබ් අතරික්සු මෘදුකාංගය තෝරන්න. ඉන් පසු සෑම අවස්ථාවකදීම එම මෘදුකාංගයෙන් වෙබ් පිටු විවෘත වීමට පහලින් ඇති කොටුව තුල හරි ලකුණ යොදා OK බොත්තම ඔබන්න.




දැන් සාමාන්‍ය පරිදි වෙබ් අතරික්සු මෘදුකාංගයෙන් වෙබ් පිටුව විවෘත වනු ඇත.

මෙම ක්‍රියාවලිය පැහැදිලි කර ඇත්තේ windows 10 මෙහෙයුම් පද්ධතිය තුලය. ඔබ භාවිතා කරන්නේ windows මෙහෙයුම් පද්ධතියේ වෙනත් සංස්කරණයක් නම් මෙම ක්‍රියාවලියට බොහෝ සෙයින් සමාන ක්‍රියාවලියක් මඟින් මෙම කාර්යය සිදුකළ හැක

මෙතෙක් ඔබ කියවූ ග්‍රන්ථයේ නිමාව මෙලෙස සනිටුහන් වේ .

මෙම ග්‍රන්ථය කියවූ පාඨක ඔබට මාගේ හදපිරි ස්තුතිය පිරිනමන අතර තවත් මෙවැනිම ග්‍රන්ථයකින් නැවත හමුවන බලාපොරොත්තුවෙන් සමුගනිමි.

ඔබට ජය!

*e* කෙත

https://www.e-ketha.home.blog

https://www.facebook.com/eketha